පුවත් පතක් ලෙස මහ තැපැල් කන්තෝරුවේ ලියා පදිංචි කරන ලදී.

වීරිය

'දෙස රැස බස යා - නොතරන පිණ යා'

6 වෙළුම
6 කැලබ

2510 පොසොන්-වප්

1966 ජූනි-ඔක්.

මිල සත 50 යි

පටුන

විදු ලිය ද?, විදිලිය ද	සංපාදක පබඳ	161
සම්භාල ළ-කැමුම	මා. මෙන්පල්	164
සරසවි මරම	ඊ. තෙන්නකෝන්	165
මැමුම් කරු හමු වුව......	අමරසිරි පොන්නම්පෙරුම	169
ගිණුම් පහදුව - 1	ජිලියන් ද සිල්වා	170
දුසුන පබඳ		171
මගේ බලපිටි සමය - 14	මොහොට්ටි දෙණු දේසිදු	177
විරු සමරුව	සිරිමත් සුගතදස	179
Sinhalese Through English - 4	Munidasa Cumaratunga	180
සෙහසුරු දසාව	අනද විජයරුවන්	182
අනුසසු විසොව		183
පද්‍ය සාහිත්‍ය විචාරය	අමරසිරි පොන්නම්පෙරුම	184
ප හ දු ව		186
උභයේ පැමිණිල්ල	චී. ජ. මු. ලොකුබංඩාර	188
කොළොම් කෙළ හවුල		192

න ව මු ව

සුබැසි දුහුන කිවියන් හට
දියුණෙහි රන් ගිරි මුදුනට
නැගෙන පිණිසෑ - රන් හිණි මග

න ව මු ව

කවි සඟරාව යි.

දෙ මසින් දෙ මසට පළ වෙයි

සත විසි පහ සැලකෙනෑ මිල.
පබැඳෙනෑ රඟ නොසැලෑකි මිල.

මේ යොමුවට
එවනු පබඳ
ඒමියු සිරිවාන්න

මේ යොමුවට
එවන්නෑ මිල
(M. N.) ප්‍රියන් ප්‍රනාන්දු.
දෙහිවලෑ, ජයතිලක මාවතේ 4/7.

එ ළි ය

නංවන්නේ

එ ළි ය යි

එළියට එළිය ඔබ ගේ ගනු මිල යි

කලප් 6කෑ ගනු මිල රු. 3 යි
කලප් 12කෑ ගනු මිල රු. 9 යි

ගල්කිස්සේ
හුළුදෙණිගොඩ පාරේ 20/1
එළිය සකසුනෙවෝ

6 වෙළුම | 6 කලබ
2510 පොසොන් - ඇසළ | 1966 ජුනි - ජුලි.

සකසුවෝ — අරිසෙන් අහුබුදු
ලියනගේ ජිනදස්

සොමුව — ගල්කිස්සේ, හුළුදගොඩ පාරේ 20/1

විදු ලිය ද?
විදිලිය ද?

සකු බසට සිප් වදන් තනා දී, එ බසින් ඒවා මෙ බසට ණයට ගැනිම සිංහලයෙහි සිප් වදන් තැනිම නොවන බවත්, එ සේ තැනෙනා සකු වදන් සිංහල කිරිය පද හැටියට වර නොනැ-ගෙනා හෙයින් නැමියාව නැති වැ, වැඩකට නැති වැ වද බහිනා බවත්, එ සේ වද බහින්නේත් මෙ බසින් තැනියැ යුතු වැ තුබුණු වදන් දහස් ගණනක් නූපන් ගෙහි මැ රඳවා බවත් එඩියෙන් නත් විටැ, අපි පැහැදිලි කොටැ දුනුමු. අද පැහැදිලි කැරෙන්නේ සකු බසින් බිඳැගැනුණු සිංහල වදනක් වුව ද නමු පද හැටියට පමණක් යෙදෙන හෙයින් එහි දු නැමියාව නැති බවත්, එ වදන වුව ද හෙළ කිරිය මුලෙකින් මැ තනා-ගැනීමෙන් නැමියාව ඇති වන බවත් යැ.

නිදසුනක් දක්වමු.

විදු ලිය යන වදනත් විදිලි යන වදනත් පිළි-වෙළින්, බිඳැගැනුණු සිංහල පියෙවියකට හා සිංහ-ලයෙහි මැ නිපන් පියෙවියකට හා නිදසුන් වෙයි.

මෙයින් විදු ලිය යනු සකු 'විද්‍යුත් ලතා' යන්න බලාගෙනැ එයින් බිඳැගැනුණු ගත්කරු වදනෙකි. ගත්කරු වදනෙකැ යි කීයේ එ වදන පොතෙහි මැ එන වදනක් හෙයිනි. මෙ වදනට මුල් වූ සකු 'විද්‍යුත් ලතා' යන්නෙහි අරුත දත් විමසමු. 'ද්‍යුත්' නම් දිලීම යි; බැබැළීම යි. විද්‍යුත් නම් වෙසෙසින් දිලීම යි. එ හෙයින් වෙසෙසින් දිලෙනුයේ 'විද්‍යුත්' යැ. 'ලතා' නම් වැල යි. විදිල්ලක් කෙටීමේ දී පෙනෙන එළි දහර පමණෙකි මේ. අද 'ඉලැක්ට්‍රිසිටි' (Eelctri-city) යනුවෙන් ගැනෙන්නේ මේ මැ නො වෙයි

මේ 'විද්‍යුත්' යන්න අපේ ගත්කරුවන් 'විදු' යනුවෙන් ද 'ලතා' යනු 'ලිය' යනුවෙන් ද ගෙනැ විදුලිය යන වදන තනාගත් හ.

'විදිලි' යනු 'විදු ලිය' යන්නෙන් වෙනස් වූ අමුතු පියෙවියෙකි. 'විදිල්ලක් කෙටුවා' යනුත් 'විදිල්ලෙකැ වේගයෙන්' යනුත් ගත් බස නූගත් සිංහල ගැමියා ගේ කට වහරේ එනු ඇසෙයි.

මේ විදිල්ල යන වදන තැනුණේ කෙ සේ ද? විදිලි + අ > විදිල්ල යි. එ හෙයින් මෙහි පියෙ-විය විදුලිය නො වැ විදිලි බව මැ පෙනෙයි.

විදුලිය යනු පියෙවිය වේ නම්, ඒ කවර ද වත් 'විදුලි' යැ යි නො සිටි. සිටි නම්, නර ලිය> නරලි, සුර ලිය > සුරලි, බැමලිය > බැමලි යනුවෙන් ද නරලිය > නරල්ල. සුරලිය > සුරල්ල, බැමලිය > බැමල්ල යනුවෙන් ද සිටියැ යුතු. එ සේ නො සිටින හෙයින් විදුලි යනු අපපදයක් බවත් විදිලි යනු මැ සුපදය බවත් පැහැදිලි යැ.

දැන් මේ විදිලි යන්නෙහි නිපැදියාව කිමෙක් ද යි බලමු. එහි ඇත්තේ ද අර 'විද්යුත්' යන තන්හි වූ අරුත මැ යි; වෙසෙසින් දිලෙනුයේ විදිලි යි. එ හෙයින් මේ 'වි' උපසගින් පෙරටු වූ දුල දිලිමෙහි පවතුයෙන් වූ කිරියදුනු (කෘදන්ත) නාමුවෙකි. වි උපසගින් යුතු මෙ බඳු තව ද පවතු රැසක් මෙ බසේ වෙයි. කිය — විකිය, නිස — විනිස, සිඳ — විසිඳ, ගත් — විගත් ඈ නිදසුනි. එ හෙයින් යමෙක් "වෙසෙසින් දිලෙනුයේ වි-දිලි යැ" යි උපත දක්වීම විදුහුරු නොවන බවක් කියා නම් ඔහු විසින් කටයුතු කරුණු දෙකෙක් වෙයි. එ නම් විදුලිය යනු විදුලි වන අයුරුත්, විදිල්ල වන අයුරුත් බසේ වදන් නියරට එකඟ වැ ඔප්පු කිරීම එකෙකි. අනෙක නම් විදිලි යන්න නිපදවන වි උපසගින් පෙරටු වූ දුල (වි-දුල) පවතුව විදුහුරු නො වතොත් විසිඳ, විනිස ඈ පවතුවලින් පැවැසෙන නියරත් විදුහුරු නොවන බව ඔප්පු කිරීම අනෙක යි. එ සේ නො කොටැ "වෙසෙසින් දිලෙනුයේ විදිලි" යැ යි උපත දක්වීම විදුහුරු නොවන බවක් කියා නම් ඒ කියයන මැ අවිදුහුරු කියමනෙකි

අද 'ඉලෙක්ට්‍රිසිටි' යන්නෙන් ගැනෙන්නේ අහසේ කොටන විදිලිය මැ නොවන බව පෙර මැ සඳහන් කැරිණි. 'ඉලෙක්ට්‍රිසිටි' යන්න සඳහා අර විදුලිය යනු ගත හොත්, 'රේඩියෝ සිලෝන්' යන්නට 'ලංකා ගුවන් විදුලිය' යැ යි ගත්තා බඳු මහ විහිළුවකට ඉඩ එයින් ලැබේ. ඇරැත්, කිරිය මුලෙකින් තැනුණු විදිලි යන වදනින් තැනෙන වදන් පරපුර හුදු නාමුවක් වූ විදු ලිය යන්නෙන් නොලැබෙනු ද වෙයි. සකු බසින් ගැනෙන හැම සිප් වදනක් සේ මැ ඉන් බිඳැගැනෙන වදන් ද හුදු නාමු පද වන හෙයින් සිප් වදනක් හැටියට සුදුසු වනුයේ උපසග ඈඳුමෙන් වදන් දහස් ගණනක් උපදවන සවිය ඇති විදිලි යන්න මැ යි.

ඉදින් යමෙක් විදුලිය, විදිලි යන දෙක මැ සම අරුත් සේ ගැන්ම සුදුසු බවක් කියා නම් ඔහු විසින් කළ යුත්තේ 'ඉලැක්ට්‍රිසිටි' (විදිලිය) යන්න හා බැඳුණු Eletrify, Electric, Electrical, Flectrically, Electrician, Electrifiable, Eleclrification, Electrization, Electrize, Electrote, Electron, E!ectroliar ඈ වදන් පරපුර අර විදුලිය යන හුදු නමු පදයෙන් තනා දක්වීම යි.

එකක් කියමු. එ නම් සිංහලයට සිප් වදන් තැනියැ යුත්තේ සිංහල කිරිය මුලක් හෙවත් පවතුවක් ඇසුරින් මැ වියැ යුතු බව යි.

එහි වාසි කවරේ දැ යි බලමු. සිංහල කිරිය මුලෙකින් තැනෙන වදන් ගණන හත් සිය ද ඉක්මවා සිටී. සිංහලයෙහි ලැබෙන උපසග දැන් අපි ඒ එක් කිරිය මුලකට එක් කරමු. එයට නිදසුනක් ලෙස 'ගත්' පවතුව ගනුමු. එ විටැ උපසග එකතුවෙන් ලැබෙන අරුත් විමසමු.

උ - ගත් — උගනී (උගැන්මෙහි)

නි - ගත් — නිගනී (නිගැන්මෙහි; නිග්‍රහයෙහි)

වි - ගත් — විගනී (විගැන්මෙහි - විග්‍රහයෙහි)

ස - ගත් — සගනී (සගැන්මෙහි - සංග්‍රහයෙහි)

අනු- ගත් — අනුගනී } (අනුගැන්මෙහි; අනුග්‍රහයෙහි)
නු - ගත් — නිගනී }

දු - ගත් — දුගනී (දුගැන්මෙහි; දුක සේ ගැනීමෙහි)

අ - ගත් — අගනී (අගැන්මෙහි - වෙසෙසි ගැන්මෙහි)

ඔ - ගත් — ඔගනී (ඔගැන්මෙහි; උසස් ගැන්මෙහි)

සු - ගත් — සුගනී (සුගැන්මෙහි; මනා ගැන්මෙහි)

පි - ගත් — පිගනී (පිගැන්මෙහි 'ප්‍රතිග්‍රහයෙහි')

අදිගත් — අදිගනී } (අදිගැන්මෙහි;'අධිග්‍රහයෙහි')
දිගත් — දිගනී }

පර - ගත් — පරගනී (පරගැන්මෙහි; 'පරග්‍රහයෙහි')

අතිගත් — අතිගනී } (අතිගැන්මෙහි- 'අතිග්‍රහයෙහි')
ඉගත් — ඉගනී }

අබිගත් — අබිගනී } (අබිගැන්මෙහි; උතුරු ගැනීමෙහි)
බි-ගත් — බිගනී }

අපගත්—අපගනී (අපගැන්මෙහි; 'අපග්‍රහයෙහි')

පගත් — පගනී (පගැන්මෙහි; පගා ගැනීමෙහි)
පිරිගත් — පිරිගනී (පිරිගැනීමෙහි; 'පරිග්‍රහයෙහි')
පිළිගත් — පිළිගනී (පිළිගැනීමෙහි)
උපගත් — උපගනී (උපගැනීමෙහි; 'උපග්‍රහයෙහි')
පස්ගත් — පස්ගනී (පස්ගැන්මෙහි; 'ප්‍රත්‍යග්‍රහයෙහි')

සිදත් සඟරායෙහි දක්වුණු උපසග විස්ස ද ගණනට ගෙනැ අපි ඒ ගණන පස් විස්සක් කොටැ දක්වුමු. එහෙත් සිංහලයෙහි ඇති උපසග සියල්ල එ පමණෙකැ යි නොගන්නැ. කු, ව, යව, තව ඈ නව අ අවිය පද රැසෙකි. අපි ඒවං ද, අප ගේ නිදසුන් වැලේ දක්වුණු වැඩි උපසග ද ගණන් නොං ගෙනැ අපට ඇත්තේ උපසග විස්සක් පමණෙකැ යි සලකමු. එ කලැ හත් සියයක් වදන් නිපදවන එක් කිරිය මුලක් පමණක් මේ උපසග විස්සේ ඇදුමෙන් තුදුස් දහසක් වදන් නිපදවන බව කිව යුතු යැ.

තව ද කිව යුත්තෙකි. කිරිය මුලකට උප-සග එකකට වඩා ඇදීමෙන් නව අමුතු කිරිය මුල් තනාගත හැකි බව යි. එයට ද නිදසුනක් සැටියෙන් 'ගත්' පවතුව ගනුමු.

පිළිගත් (පිළිගනී)
උපසග එකක් ඇදුමෙනි.
සුපිළිගත් (සුපිළිගනී)
උපසග දෙකක් ඇදුමෙනි.
ඉසුපිළිගත් (ඉසුපිළිගනී)
උපසග තුනක් ඇදුමෙනි.

තව කිරිය මුල් තැනියැ හැක්කේ උපසග ඇදීමෙන් පමණෙකැ යි නො සිතුව මැනැවි. කිසි යම් නමු පදයක් ඇදීමෙන් ද ඒ කළ හැකි යි.

වැඩි - ගත් — වැඩිගනී (වැඩි ගැන්මෙහි)
උනු - ගත් — උනුගනී (අඩු ගැන්මෙහි)
ලුහු - ගත් — ලුහුගනී (ලුහු ගැන්මෙහි සැහැල්ලු ගැන්මෙහි)
අය - ගත් — අයගනී (අයගැන්මෙහි)
රස් - ගත් — රස්ගනී (රැස් වීමෙහි)
අරක්-ගත් — අරක්ගනී (අරක් ගැන්මෙහි)

සිප් වදන් තැනීමෙ දී නිපං (නිපාත) පද ද මහ මෙහෙයක් ඉටු කෙරෙයි. කවර හෙයින් ද? උපසග පද යුතු කිරිය මුලට නිපා ඇදීමෙන් ද නමු පද පද යුතු කිරිය මුලට නිපා ඇදීමෙන් ද නව නව අමුතු පවතු තනාගත හැකි හෙයිනි.

මෙ තෙක් දක්වුණේ නමු පද පසෙකැ ලා, හුදු කිරිය පද පමණක් වුව ද උපදවන වදන් පරපුරේ සුළු විතරෙකි.

විමසත් විමසත්, සතු බසින් ගෙඩි පිටින් වදන් බංගැන්මෙන් හෙළ බසේ සියත් කම නොමැකුවංට මෙයට සියවස් විස්සකට උඩැ දි ද නිවන් තෙක් බුදු දහම හෙළයනට වටහවන්නට නිසි සිප් වදන් සවියෙන් යුතු වූ හෙළ බස අද ද සව් ලෙව් නුවණ රඳවන්නට එ තරම් මැ සුදුසු යැ.

පවතුවකට උපසග ඇදීමෙන් හෙළ වදන් තැනුණු නියාව බලා ඒ අනුවැ නව වදන් තැනීම කට නො හැක්කෙකැ යි කීමත්, 'වක්කරේ' උගන්-වන්නේ දෙලොස් වරකට පමණක් නිසා දහ තුනෙන් වැඩි කිරිම නොහැක්කෙකැ කීමත් එක් බඳු යැ.

වෙසෙසින් දිලෙනුයේ විදිලි යනු විදුහුරු නියාව දනැගන්නට එ තරම් නුවණෙක් ඇවැසි නො වේ!

සමනොළ ළ-නැවුම

රුවන්පුරැ
මා. මෙන්පල්

“සුර රද සමඟ සමඟින් සුරඟන   එ වර
පැහැ තද මඳාර පරසතු මල්   පහර
කැරැ පුද වඳන රැඳි මුනි සිරි පා   තඹර
සකි සඳ පෙනේ සමනොළ ගල   නැගෙනහිර”

සුරඟනන් සමඟින්
සමන් සුරිඳුන් පුද දුන්
සරසතු මඳාර පුද
එ දවසැ එ සේ ලදුයෙමි

වත්මනැ ගමන් මඟ
ඉපැසු ලෙසින් සැලැසිණි
එ බැවින් නිගරු කම් ඇති
නරයෝ නිබඳ පැමිණෙති.

පෙරැ බැතිමත් සඬින්
වන ගබ ද ගුම් ගැන්විණි
මෙ කලැ කැමි ගී ගැයුමන්
ඇසෙන ම - සඳ රැඳ දෙයි.

කෙලෙඳුන් නැට කැළු
සළින් මුනිඳුන් වත් මඟැ
මෙ දැ අග කුමරින් එන
ගැට කපන්නෝ වෙත් මැ යි.

බුදුන් සිරි පා පසා-
සින් හේලි වූ මා හිස
පවිටු මෙ දනන් පහසින්
කැළි වනු කෙ සේ ඉවසමි?

යක් හෙළ දනන් පර-
පුරිතා’ හෙළ දනන් සතු
වනු අද වෙමින් නෝ වනු
කඳු ගඳ නිබඳ වපුරයි.

සවසැ වෙරළ

ගින්තොටැ, පියදිගම්හි
හා. පෙ. විකුමසිංහ

ගොවුනන් ගොවුනියන් ගේ සුපුරුදු   පහස
පකම්න් සිරි වෙරළ ද ලා හිරු ගෙ   ඇස
සෙද සෙද ඔබන කලැ උන් උන් ගෙ පිය   ලස
පවතා රහස් කියමින් යේ දිදී   රස

රළ ගෙඩි තරඟයට මෙන් දිවැගෙනැ   එනවා
වෙග වැඩි නිසා ගලැ වැදූ විසිරි   යනවා
“අහසේ ඔබ නැඟු හෙවලට මේ   වෙනවා”
කනු උවහසින් ගොවුනන් හට   හඟවනවා.

සරසවි වරම!

ර. තෙන්නකෝන්

අපට සරසවියක් ඇති බව ඇත්තෙකි. එහෙත් එය දඹදිවෙව් තක්සලාව, නාලන්දව වැනි හෝ ලක්දිවේ විජයබා පිරුවන, සුනෙත් මහ දෙවි පිරුවන වැනි හෝ එකෙක් නො වේ, එය හුදෙක් මහ බිරිතානියේ මැදි පමණේ හික්හලක් බඳු එකෙකි. එහි සියල්ල කැරෙන්නේ පර බැවින් සැහෙන පමණ දුරට බාල වූ ඉංගිරිසියෙනි. එහි දු එක් විදියෙකැ බොරු සිංහලයෙක් ඇති. එය සැබෑ සිංහලයෙන් ඉදුරා වෙනස් වූවෙකි. එහි පෙර දිග බස් ඇදුරෝ ඉංගිරිසියෙන් එ බස් උගත්හු වෙති. එ හෙයින් ඔවුන් ගේ පෙර දිග බස් පිළිබඳ පඩි බව මහ බිරිතානියෙන් ලද එකෙකි. මහ බිරිතානියේ සිංහලය දන්නා වියතුන් නැතියෙන් අපේ සරසවි සිංහල ඇදුරෝ සිංහල නොදන්නාවුවන් ගෙන් සිංහල උගත්හු වෙති. ඔවුන් ගේ සිංහල වදන් අමු අමුයේ පර වදන් කළා මවාගත්, හොල්මන් සේයා බඳු විකුළු යි. ඔවුන් ගේ වියරණය ඉංගිරිසි වියරණයෙන් ගසා ගත් පතුරු රැසෙකි. ඔවුන් ගේ පබඳ නය පුරා මැ ඉංගිරිසි යි. ඔවුන් අදුනන කව ඉංගිරිසි කැදී කරුවන් ගේ පබඳ යි. එ හෙයින් ඔවුන් පෙර දිග ඇදුරකු ගේ පබඳක් විවිසීම විසින් ලබන්නේ හෙවත් ඔවුන් ගේ මැ බසින් කියනවා නම් 'විද්‍යාත්මක පර්යේශනයකට හසු කොටැ බලන්නේ' යල් ද පැනැ ගිය ඉංගිරිසි නියායේ පිහිට යි. ඒ හරියට මැ පෙර දිග සිරිත විරිත අනුවැ හැදුණු මිනිසකු ගේ පවත, අවර දිගැ කිතුනු සිරිත අනුවැ පිරික්සා විනිස දීමක් බඳු බොළඳ කමෙකි. අප ඉංගිරිසියන් හට ගැති වැ සිටි අවදියෙකැ මේ බොරු ඉංගිරිසි පණ්ඩිත බව ඉවසා සිටියත්, රාහු ගෙන් මිදුණු ඉර හඳ සේ සියත් බව ලැබැ සිටැ ගත් පසු මේ බොරු ඉංගිරිසි පනියාවත්, බොරු සිංහලයත් වැනැසියැ යුතු වෙයි. එ සේ නො කළ හොත් අප ද බොරු මිනිසුන් රැසක් වනු නියති.

පර ගැති බව සිංහලයා හොඳින් අදුනන පවතෙකි; ආදි අපේ ගත් කරුවන් ද, සකු මගද ඈ බසින් වූ පබඳ ගැති වැ ගත් සැපැයූ බව ඇත්තෙකි. එහෙත් එයින් අපේ මිනිසුන් ගේ නිමැවුම් පිළිබඳ කරගැටි වුණා මිසැ බසට විපතෙක් නොසිදුණු වූයේ යි. සකු මගද දෙක ද පෙර දිගැ වහර වූ බස් වූයෙන් ඒ අසරින් පබඳ කිරීම අල්ලාපු ගෙදෙරින් ඇඳුම් පැළැඳුම් පිරුළට ගෙනැ සැරසී වත් බොහොසත් කම් බැහැරට පැමක් බඳු යි. ඉංගිරිසිය පැළ දිග බසෙකි. එයට ගැති වැ සිංහලයා පබඳක් කිරීම බැහැරින් පැමිණි පිට රැටියා ගේ අත් පා මෙයට ගිය දස්සා ඔහු අළ කලිසමෙකින් සැදි මහත් කම් සිය ගෙට පෙන්නීමක් බඳු විළි නැති කමෙකි.

දුසිරිතින් රැකෙන්නවුන් කුල පනස් නොරිසි වන්නා සේ මැ, සොර කැමින් රැකෙන්නවුන් රජ නිය නොරිසි වන්නා සේ මැ, අදහමින් රැකෙන්නවුන් සික පද නොරිසි වන්නා සේ මැ මේ, බොරු සිංහල මවන 'විද්‍යාත්මක' පඩියෝ වියරණය නොරිසි වන්නෝ යි. වදන් නියර, සුබස් නය, වියරණය යන දුය නයින් හට අඳු කොළ සේ ද, ගෝනුසුවනට පොල් තෙල සේ ද, මුසිලීමයනට උරු මස සේ ද නො ඉවැසුම් දෙන දුය යි. කවර ලෙසෙකින් කිවත් නිවැරැදි වීමත් එ මැ සෙස්සවුන් හට ඉබේ මැ වැටහෙනවා වීමත් පමණෙකි ඔවුන් පතන්නේ.

යම්තම් ඉංගිරිසිය අසරින් සිංහල පරම ඉඳුරු පඩියන් සේ වෙස් බැඳැගෙනැ, සිංහලය නාඳුනන දනන් හට සිංහලයෙන් පෙළහර පානා රට පඩියන් නිසා 'සීමා සහිත, රට සිංහල බසක් ද, වතුරැ බිස්නා හොය දැලේ රැස් වන කබබ පට පෙඩින් පහළ වනු දක්නට ලැබේ. 'සීමා

ඔවුන් ගේ බසෙහි සිටියේ 'සීමිත, කියා යි. බොහෝ විට, අපේ පඬු පඬුවන් හට ද ඒ අව සදක් බව නො පෙනී යනවා ද දක්නට ලැබේ. සිංහලය නො අදුනන වධක්ක සිංහලයා බෙහෙවින් සිංහල වදන් මවාගන්නට බලන්නේ සකුවෙනි. යම්තම් සකුයේ ශෙස්යා මතක් ඉහට වැටුණු පමණින් මෙ තෙමේ එ ද මැ බුදුනු බව ලත් මුසිලිමයා සික පද වලදින්නා සේ සකු වදන් නය අනුව, සිංහල වදන් මවන්නට බැසැ වරදවා ගනී. වැරදුණු එක යළි නිවැරැදි කොට, ගැන්ම මිනිස් කමක් වකුදු බොරුව පඬුවමක් නොවනුයෙන් මෙ තෙමේ තමා අතින් වූ වරද ද පෙළඹර වෙසෙසක් හැටියට අභවා තමන් අනුව, යන අද බාලයන් නොමහට දක්වයි. එ අයුරු පෙළහර ලකුණෙකි මේ 'සීමිත' යන්නත්. ඉංගිරිසියෙහි 'සීමා' අරුතෙහි ද, 'සීමා' කිරීම, අරුතෙහි ද 'Limit' යන එක් මැ වදන යෙදේ. එ හෙයින් එහි සීමා කරන ලද (හෙවත් සීමා සහිත) යන අරුත දීමට 'අයු කල් කිතක විබත්' යොද 'Limited' යන්න ඒ බසේ නිපදවනු ලැබේ. සකුයෙහි වනාහි 'ද පියෙවි' අගට අයු කල් කිතක විබත් විසින් 'ත' යන්න යොද පසරුත් වෙසසුන් සදන් නිපදවනු සිටිති.

මැරුම්හි 'මෘ'(ද පියෙවිය) + ත(විබත) මෘත(මැරුණු)
ඇසුම්හි 'ශ්‍රැ' ,, ,, ,, ශ්‍රැත (ඇසුණු)
කැරුම්හි 'කෘ' ,, ,, ,, කෘත(කැරුණු)
ඇ විසිනි.

එ බසෙහි 'සේට' ('ඉ, සහිත) ගණයේ ද පියෙවියකට එ මැ 'ත' විබත යෙදීමේ දී 'වියරණයක්' විසින් ද පස මැද 'ඉ' පැමිණැ සිටීම නියර යි.

දකුම්හි 'දෘශ්, (දර්ශ්) +ත 'දර්ශ් (ඉ)+ ත' දර්ශිත (දක්වුණු) ලිවීම්හි 'ලිඛ්' + ත 'ලිඛ්' (ඉ)+ත, ලිඛිත (ලියැවුණු)

ඇ විසින් ඒ පෙනේ. එ බසෙහි තිබා කවර බසෙකැ දු ද පියෙවියකට විනා සද පියෙවිය (නාමය) කට කිතක විබත් හෝ කිරිය විබත් හෝ යොදන නියමයෙක් නැති. එහෙත් මේ රට පඬියා 'සීමා' යන සකු වදනට 'ත' යන කිතක විබත ඉංගිරිසි වියරණ නයින් යොද, සකුයෙහි 'සේට ධාතු' සුතුරින් පද සෑදීම නිමවා 'සීමිත' යැ යි විසුළු වදනක් මැවී. ඉංගිරිසියෙන් සිංහල ඉව අල්ලන සවුවෝ ද ඉංගිරිසි හෝබාව වැදුණු කීව පැමත් වියත් බැවේ ලකුණු කොටැ තැකූ පඬුවෝ ද අග මුල නො විමසා වැඩට එය ගත් හ. එහෙත් ඒ අනුසරින්

පවුරු බඳිනා ලද 'ප්‍රාකාරිත'
ගස් වවන ලද 'වෘක්ෂිත'
පාරවල් දමන ලද 'මාර්ගිත'
සරසවි පිහිටුවන ලද 'විශ්වවිද්‍යාලයයිත'
පොත් කරන ලද 'පුස්තකිත'

ඇ විසින් තවත් එ හැටි වදන් මවන්නට නො බලති වරද එළි වූයෙන්. වූ වරද ද නිවැරැදි කොටැ නො ගනිති පඬුවම බාල වෙයි යන හැඟිම බලවත් හෙයින්. එය දන් වහරට වැටී ඇති හෙයින් නිවැරැදි වෙති යි රට පඩි සවුවෝ එ මැ රක්නට ද නො විළි වැ බලති. එහෙත් රට බොරු සිංහල වහරට මිසැ දසැබෑවි සිංහල වහරට එ හැටි අවවදන් වැටී නැති බව අප විසින් සැලැකියැ යුතු වෙයි.

අපේ ආදී ගත් කරුවන් ගෙන් අයෙක් අරුත් විසින් ද, පද විසින් ද දඹදිවේ ඇදුරන් ගේ පැබැඳුම්හි කොටස් ගැන්මෙන් පබද කළ හ. ඔවුන් එ කෙලේ තම වියත් කම් පළ කිරීම් විසින් නො වැ තමන් ගේ හරසරට ලක් වූ පැරැණි පඬුවනට ගරු බුහුමන් දක්වීම විසිනි. බුදුනුවන් අදහන දහම දඹදිවේ වූ බුදුන් විසින් දෙසන ලද්දේ යි. මෙ බුදුනු පැවිද්දන් එ බුදුන් ගේ දහම දත් දඹදිවේ මහ සහන වදළ වදන් මැ ගෙනැ දෙසනු මිසැ අමුතුවෙන් බුදු දහමක් පහළ කොටැ දෙසන්නට යැ? එ හෙයින් බණ දහම පොත් කිරීම ඊට පළමු කොටැ තුඹු පොත්හි ඇතුළු වැ ඇති දූය අසරින් මැ වියැ යුතු. ඒ පැසැයිමට මිසැ ගැරැහීමට කරුණෙක් නො වේ. බණ දහම පිළිබඳ වූ ඒ සිරිත දියින් දිගට පැවැතැ එන් මැ එ අනුසරින් දඹදිවේ රුසියන් ගේ දසුන් ද, කිවියන් ගේ කිවි කම් ද එ සෙයින් මැ ගුරු කමට ගැන්ම ඇති වී. රුසි බසින් දෙසුණු (ඍෂි භාෂිත) දූය විසින් ඒ සැලැකිණි. රුසියන් ගේ දසුන්, ඔසුවම්, නකත් සතර ඇ දූය ද එ සෙයින් මැ ගැන්මෙහි වරදෙක් නො වේ. එහෙත් කව් පබද පිණිසැ දු එ මැ සොයන්නට යාම අපේ පැබැඳුම් හැකියාව පිරිහෙන්නට කරුණු වෙයි. කවෙක් වියතකු ගේ පබදක් මිසැ රුසියකු විසින් ලොවට පහළ කරන ලද දසුනෙක් නො වේ.

දඹදිව අසල් මැ රට වූයෙන් ද, එහි වදන් අපේ කනට හුරු වූයෙන් ද, එහි මිනිසුන් අප

නිති ඇසුරු කළ හෙයින් ද එහි එකකු ගේ පබඳෙකින් අරුතක් ගතත්, වදනක් ගතත් අමුත්තකු පැමිණියා බඳු වෙසෙසෙක් එයින් අපට නො දුනේ. අපේ රටෙ ඉගැන්නීම පන්සල් මගින් සිදු වූ තාක් කල් ඒ පවත එ සෙයින් මැ රැකුණේ යි. එහෙත් පර දනන් හට ලක්දිව නතු වූ පසු ඔවුන් විසින් ඇති කරන ලද නත් අයුරු විදු හල්හි ඉගැන්නීම් ඉංගිරිසියෙන් කැරිණි එයින් උගත්හු ඉංගිරිසියෙන් ඉගෙනීම ලැබුවෝ වූ. නැණවතුන් වන්නට නම් දත යුත්තේ මගදය හෝ සකුව හෝ නො වැ ඉංගිරිසිය යැ යන ඇඟීම මිනිසුන් තුළැ ඇති කරවන ලද්දේ මෙ අවදියේ යි. ඉංගිරිසිය උගතුන් විදු සක්විති බව පෙන්විය හැකි වන්නේ සමදරු පිළෙල් වූ ඉංගිරිසියනට නො වැ බලුගැති වළට තල්ලු කොටැ දමන ලද සිය රැසේ නුගතුන් හට යැ යනු දත් මෙ සිංහල (හෙවත් කළු හම්) ඉංගිරිස් කාරයෝ සිංහලය, මඩ තවරා ගන්නා සේ එහෙත් මෙහෙන් තවරා ගන්නට වූ හ. එයින් සිංහලයන් කෙරේ ඉහළින් වැජැඹෙන ගමන් මැ සිංහල මහ පඩියන් හැටියට ඉංගිරිසි දනන් ගෙන් තැකුම් ලබන්නට ද ඔවුන් හට හැකි විණි. එනහත් ඇත්තට මැ සිංහලය දැනු රිසි වූ, කිසි ඉංගිරිසි උගතෙක් පන්සල් අසරින් සිංහලය ඉගෙනැ එයින් පුරා වැඩ ගත් හ ඒ කෙලේ කලාතුරෙකින් එකකු දෙදෙනකු පමණ යි. මැනැ අවදියේ දී ඉංගිරිසියන් වුව ද සිංහලය ගැනැ මද සැලැකිල්ලක් දක්වන්නට වුයෙන් ද, ඉස්කෝල මඩුල්ලේ සිංහල ඉස්කෝලත් වූයෙන් ද ඉගෙනීමෙන් ඉංගිරිසියන් උපතින් සිංහලයන් දත් රට හිංගල පඬුවන් ගේ පහළ වීම ඇරැඹිණි. සිංහල ඉස්කෝල කරා යවනු පිණිසැ අණ පනත් පත් සිංහලයට නැඟීම ද, සිංහල හසුන් පත් දිරැක්තෝරුවාට දන්නා පිණිසැ ඉංගිරිසියට නැඟීම ද, එංගලන්තයේ ඉංගිරිසි සරසවි කෙරෙන් ඉවත දමන ලද ඉගැන්නුම් නය දක්වන සටහන් අනුසරින් මෙහි ඉස්කෝල දෙපාර්තමේන්තුව පිළියෙළ කරන 'පරිපාටි' කතා සිංහලයට නැඟීම ඈ දැය ද නිසා එ රට සිංහල පඬියන් ගේ නැඟී සිටීම සිදු විය. අන් දැයක් ඇයි, සිංහල අකුරු නාඳුනන, එ වුවත් සිංහල ඉස්කෝලේ ළමයන් ගේ දැනුම විමසන හික්හල් සිරික්සුවෝ එක්දස් නව සිය විසි ගණන්වලදී පවා සිටිය හ. 'වක්‍රලේඛණ' ඈ අරුම වදන් පහළ වූයේ ඒ අවදියේ දී තමා. අන් දැයක් ගැනැ කවර කතා ද! අද ඉස්කෝලවලැ ඉගැන්වෙන රට හිංගල වියරණය පවා ඉංගිරිසි වියරණයෙන් මවන ලද්දේ වී. පන්සලේ හැදෑරෙවෙන සිංහල වියරණය සකු මගද දෙබසට ගැති වැ කරන ලදැ යි ගුගුරන අපි ඉස්කෝලේ හැදෑරෙවෙන සිංහල වියරණය බතුරු කෝලමක් බව නො දක්මු. ඇයි? ඒ විහිළු දක්නට ලැබෙන්නේ ඉස්කෝල සිසුන් හට පමණක් හෙයිනි.

ඉංගිරිසි වියරණයෙහි ඇති

Sentence
Subject and Predicate
Clause
Phrase
Simple Sentence
Compound Sentence
Complex Sentence
Direct Object
Indirect Object

ඈ සිය ගණන් නම් සිංහල වියරණයට අමු අමුයේ කුලවද්ද ඇති සැටි ඉස්කෝලයේ "බස' ඉගැන්නීමට පිළියෙළ කැරුණු පොතක් බැලූ විට පෙනී යනවා ඇති. ඒ හා මැ අපට සරසවි මඩුවෙක් ද පහළ වූයේ යි. එහි ද පෙර දිග බස් ඉගැන්නීමට පැමිණියෝ රට හිංගල ඇදුරෝ යි. උෟ තුමූ සිංහල බස පිළිබඳ පඬුවම මහ බිරිතානියේ සරසවිය මඩුවලින් ලැබුවෝ වෙති. ඔවුන් එ පිණිසැ හදරන්නේ සකස්කඩය. නම්පොත, බුද්ධගජ්ජය ඈ පොත් යැ. ඒ පොත් ඔවුනට 'මහා ග්‍රන්ථ රත්නයෝ'යි. ඒ අනුවැ සිදත් වියරණයත් පන්සල් ඉගැන්නීමත් යට වී ගියේ යි. ඉංගිරිසි වෙස්මුණු වියරණයත් රට හිංගල 'අධ්‍යාපනයත්' ඉස්මතු වූයේ යි. සියත් බව නො දත් බව වූයේ යි. පරගැතියාව විදු හුරු පිළිපැදුම වූයේ යි.

ආදි සකු මගද පොත් පෙරළීම වෙනුවට දැන් ඉංගිරිසි පොත් පෙරළීම රට ගොම්බෙල්ලන් බෝ වුණා සේ බෝ වූයේ යි. ඒ මහා මැ අපූරු වැකි ගැළැපිමුත් ඇති වූයේ යි. ඒවා ඔවුන් හට මැ මුත් සිංහලයන් හට අරුතක් අඟවන වදන් හෝ වැකි හෝ නො වෙයි. එ වදන්හි, එ වැකිවලැ ඇති අමු හෙලු බව මුවා කිරීමට උෟ තුමූ 'ශාස්ත්‍රීය' 'විද්‍යාත්මක' යන පට නාම් පහළ කොටැ ගත් හ.

මේ රට පඬිවරුන් සියත් බැවින් නුමුත් පෙර පබඳුවන් ගේ කව් පවා කිසි සැකක් බියක් නැති වැ විවිසීමට ඉදිරි පත් වෙති. හෙළ පබඳ ආරක්, හෙළ වදන් නියරක්, සැබැවි හෙළ බවක් නැති මෙවුන් හට එ වන් වැඩට දිරිය දෙන එක් මැ කරුණ නම විළි හිඟ බව පමණ යී.

ඔවුන් හෙළ කිවියකු ගේ පබඳක් විවිසින්නේ පිළිනි වූ ඉංගිරිසි විවිසීම නියායක් අනුවැ මිසැ පෙර දිග නයක් අනුවැ නො වේ. බුලත් විට පෙර දිග මිනිසාට මිහිරක් තොසක් දනවන දූයෙකි. එහි රස ගුණ බ්‍රිතානියේ මැහැල්ලක ගේ රස විඳීම් නය අනුවැ මෙ රටේ මිනිසුනට දක්වන්නට ඉදිරිපත් වීම සිනා උපදවන්නෙකි. මේ රට පඬියන් ගේ හෙළ කව් විවිසීම ද එ අයුරු යී.

ඉංගිරිසියේ තෙද බල මහිමයෙන් සිංහලයකුට සියලු කල්හි වැජැඹෙන්නට පිළිවන් කමෙක් නැත්තේ යී. ලංසි නෝනා කෙනකුන් හට මෙහෙ කිරිමට කොළඹෙ ඇගේ නිවසේ ගොස් රැඳුණු ගම් වැසි ගැනියකට ඒ ලංසි අඟන විසින් ඉවත ලන ළද පැරණි ගවුම, සපත්තු ඈ දූය රැස් කොටැ ගෙනැ ටික දිනක් ගම් වැසියනට 'නෝනා' වෙසින් පෙනී සිටින්නටත් ගොත ගසමින් සිංහල බසින් දෙඩන්නටත් හැකි වූ අවදියකුත් පැවැති බව ඇත්ත යි

එහෙත් එ වන් අවදි වැඩි කල් ඇල්ලා සිටින්නේ නැති. ඉංගිරිසියන්ගේ, ඉක්මනින් වෙනස් වන විවිසීම් නය අනුවැ සිංහලයකු ගේ පබඳ විනිසීමෙ පඩි බව ද අර ගම්වැසි අඟන ගේ 'නෝනා' වෙස වැන්නෙකි.

(අපේ කවි)

'සරසවිය බැලුම්'-
සෙන්හි වෙත් වා කිවි දන
පෙදෙහි රස හැඟී විඳුනා
දෙනෙතා ඉතා දුලබෝ

—මහ පැරකුම්බා

සරසවිය ගේ බැලුම් සිදෙකින් —සත්නම්
දුනුමෙකින්, දනෝ කිවියෝ වෙත් වා!
පදයෙහි රසයන් හැඟැවීමන් විඳුනා
දනෝ ඉතා හිඟ වෙති.

—කුමරතුඟු මුනිදස්

මැවුම් කරු හමු වුව
මා ඔහුට කියන බස

ගාල්ලේ මිහිඳු විදුහලේ
අමරසිරි පොන්නම්පෙරුම

1. ඔබට බඹු යන නම
　　දුන්නේ අපේ මුත්තන්
ඇයි ද මහ බඹ ඊයේ
　　දුන් වත් මගෙන් දන්නේ!

2, ඇඹුම් - මැවුම් - කරුට
　　බස් නයින් අඹු නම වෙයි.
මනා වැ අඹනුයෙන් ඔබ
　　බි + අඹු > බඹු නම ලද්දෝ

3. එ නමුත් ඔබෙ ඒ
　　පැරණි මැවුම් අද ලොවට
නොගැළපෙනුයෙන් ඒ නම
　　දුන් නම් ඔබට නොසරි යැ.

4. දනවත් දිළිඳු යන
　　සේ දෙ ගොඩකට මනු දන
බෙදුම බඳු රුදු බිඳුමෙක්
　　හා, දියතෙහි තවත් නැති!

5. අද මෙ බෙදුමෙන් ලොවැ
　　එක මැ පොර පිටියක් වී
ඉසි, කෝ ගිනි මැලේ හී
　　ඔබෙ දරුවෝ පැලැහෙති.

6. මහවා ගේ ගොදුර
　　සුළුවා වන නියායෙන්
සත් වග මැවූ ඔබ ගේ
　　ගමන ගැනැ මට නම් සැක යි.

7, උපන් වන මැ ලොවෙහි
　　වන්නන් වැඩි බව දකැත්
සළුව මවා "තාත්වික"
　　ගතිය ඇයි ඔබ මැකුවේ?

8. පොල් ගහ මවද්දී
　　ඇයි එහි ගෙඩි ගහ මුලැ මැ
නො මවා මුදුනැ මැවූයේ?
　　ඉදිරිය ඔබ නුදුටු හැටි!

9. අද නම් රුපියලක්
　　දී වත් ගෙඩි කඩවනුව
බැළයකු සොයාගැනුමත්
　　බැරි කරුණෙකි අප ගමේ!

10. ලොවෙව උගතුන් යැ යි
　　අතළොස්සක් මවාලා
වැඩි දෙනා හට ඔබ ගෙන්
　　කැරුණේ මහත් වරදෙකි!

11. ගව රළක් දක්කා
　　යන මිනිසා සිව් පයින්
නොයන සෙ මැවූ ඔබ නම්
　　පරණ හණ මීටි කරුවෙකි!

12. වියරණ යැ යි එකක්
　　ඔබ නො මැවූ නම් අහෝ
අපේ සරසවි ඇදුරෝ
　　සරසවියටත් ඇදුරෝ!

13. ඔබ අඹු - සරසවිය
　　කටෙට ලං රකිනා මුත්
ඉඩක් ලද හොත් ඇයි ඈ
　　කිවින් වෙතැ දිවැ-යන්නේ?

14. යළි මැවිල්ලට ලොව
　　ඔබ හට ලැබුණොත් ඉඩක්
මගේ මෙ සුළු සැලැකැවුම්
　　සලකා බැලුව වැඩ වේ.

ගිණුම් පහසුව—1

පාසලේ ගණන් පැටුම සිසු දරුවනට පියනම ඉසව්වක් කිරිමේ වැඩ පිළිවෙළෙක් මෙ තැන් සිටැ ඇරඹේ. එළියෙහි පළ වන එ මැ ලිපි පෙළෙහි පළමු වැන්න යි මේ. එකතු කිරිමේ පහසු මැ මග මෙයින් හෙළි වෙයි.

ජූලියන් ද සිල්වා

මහ නම්වර දෙකක් සිතින් වැඩි කැරුම එ සේ මෙ සේ දෙයක් නො වේ. එහෙත් එය නොකළ හැක්කෙක් ද නො වන්නේ යි.

ලොවේ පළ පිළිවෙළ අනුවැ නම්වර හැල්ලක් මැ ලියා සිත ද මහත් සෙයින් වෙහෙසට පමුණුවා යැ එ වැන්නෙකැ පිළිතුර අප ලබාගන්නේ. කුඩා දරුවනට නම්, ඒ වඩා මැ කරදරයක් සේ දනෙන්නේ. බොහෝ විටැ දරුවනට ගණිතය එපා වන්නේ ද ඒ කරදරය නිසා මැ යි.

එකතු කැරුම, වැඩි කැරුම, බෙදුම යන දෑ ගණිතයෙහි පදනම බව සබා යැ. එහෙත් ඒ ගණිතය මැ නො වේ. ගණනක් සෑදීමට වහල් වන අවි වැනි දේ යැ. යම් මැ වැඩක් පහසුවෙන් කැරුමට නම් එයට යොදන අවිය ලෙහෙසියෙන් මෙහෙයැවියැ යුත්තේ යි. එකතු කැරුම, වැඩි කැරුම, බෙදුම යන අවි ලොවේ පළ පිළිවෙළ අනුවැ මෙහෙයැවීම කිසි සේත් පහසු නො වේ. එ බැවින් ගණිතය යන වැඩය ඉවු කැරුම ද එ නිසා මැ බරපතළ කාරියක් ලෙසැ හැඟී යන්නේ යි.

කුඩා දරුවන් ගේ මහ පින නිසා වියැ හැකි යැ, ට්රැක්ටන්බර්ග නමැති රුසියානු වියතා 1888 ජුනි 17 වන ද ලෝ පහළ වූයේ. ඉංජිනේරු විදුව මැනැවින් උගත් හේ, ගිය මහ යුද සෙමෙහි හිට්ලරයන් විසින් හිර කඳවුරෙකැ දමන ලදු වැ බොහෝ කලක් දස දුක් වින්දේ යි. ඒ දුක අඩු කැරගැනුම පිණිසැ ගණන් සතර ගැනැ සිත යෙදවී. එහි පල විසින්, එකතු කැරුම, වැඩි කැරුම, බෙදුම යන දේ සඳහා නව පහසු පිළිවෙළ හේ වටහාගන්නේ යැ. ඔහු සොයා ගත් දෙයින් බිඳක් වත් එළි-පෙහෙළි කැරුමට යැ මෙය ලියැවෙනුයේ.

පළමුවෙන්, අපි, එකතු කැරුම සලකමු. එහි කරුණු දෙකක් කෙරෙහි අප ගේ සැලැකිල්ල යොමු වියැ යුතු යි. එකෙක් නම් එකතු කැරුම හණිකට කළ යුතු යැ. අනෙක නම් සරි ලෙස කළ යුතු යැ. මදක් දිග නම්වර වැළක් සරි පිළිතුර එන ලෙසැ එකතු කැරුම අප කී දෙනකුට කළ හැකි ද? තව ද වැදගත් කරුණෙකි. එ නම් ලද පිළිතුර හරි ද වැරදි දැ යි දනැගැන්මට යළි එකතු කළ යුතු වෙයි. එ වර වෙනස් පිළිතුරක් ලදහොත් තව ද වරක් එකතු කරන්නට සිදු වන්නේ යි. නියම පිළිතුර ලද විග වටහාගන්නට සමහර විටැ මෙ සේ කිහිප වරක් මැ එකතු කළ යුතු වන්නේ යි. එ බැවින් ලොවේ පළ පිළිවෙළ අනුවැ එකතු කැරුම එ තරම් පහසු කරුණෙක් නොවන්නේ යැ.

නව පිළිවෙළ මෙයට ඉඳුරා වෙනස් එකෙකි. ඒ පිළිවෙළ අනුවැ, හණිකට එකතු කළ හැකි වෙයි. එ පමණෙක් ද? නැති. බෙහෙවින් එක් වරට මැ හරි පිළිතුර ලැබෙන්නේ යි. තව ද,

'හරි බලන්නට' හෙවත් සරික්ෂන්නට (සරි+ඉක්ස) යළි එකතු කරන්නට වන්නේ නැත. කො තරම් පහසුවක් ද?

පිළිගත් පිළිවෙළ අනුවැ එකතු කරන විටැ නිතර වරදින්නේ ඇයි? ගණනක් ගෙනැ බලමු එය එකතු කරන විටැ සිත මෙහෙයවන්නේ කෙ සේ ද කියා. මෙන්නැ නිදසුන. 2+9+6+7+9+8+7+9+8 මෙන්න සිත මෙහෙයවන පිළිවෙළ. 2යි, 9යි, 11යි; 6යි, 17යි; 17,යි 7යි, 24යි; 24යි, 9යි, 33යි; 33යි, 8යි, 41යි— යන විසින් සිතෙහි රැඳැවියැ යුතු නම්වරය එන්න එන්න මැ වැඩි වේ. මෙ සේ ලොකු නම්වරයකට තවෙකක් එකතු කරන විටැ යැ වරදක් ඇති වන්නට ඉඩ ඇත්තේ. ඉදින්, ඒ දෙස මකන්නට කුමක් කළ යුතු ද? එක් වරෙකැ එකතු කරන නම්වර කුඩා වියැ යුතු යැ. කෙ සේ ද එය කරන්නේ? එය මතු පැහැදෙයි.

අප ගේ නම්වර සැටියට (Number system) ඇත්තේ ඉලක්කම් දහයෙකි. 0, 1, 2, 3, 4, 5, 6, 7, 8, 9 යනු යැ ඒ. මේ ඉලක්කම් එකිනෙකට එකතු කැරුමට උගැන්ම එ තරම් අසීරු කරුණෙක් නො වේ. පළමුවෙන් කළ යුත්තේ ඒ ඉලක්කම් එකිනෙකට එකතු කැරුම මනා ලෙසැ පුහුණු කැරුම යි, නව පිළිවෙළ අනුවැ මෙ පමණ යැ එකතු කැරුම අතින් දැනැගත යුතු.

ඉක්බිති වැ පුහුණු කළ යුතු තව ද දෙයෙකි. එ නම්, ඉලක්කම් දෙකක් එකතු කළ විටැ එන එකතුව 11ට වැඩි වූ විටැ, ඉන් 11ක් අඩු කැර ඉතුරුව මතක තබාගැනුම යි. මේ ඉතා පහසු වැඩෙකි. එකොළහක් අඩු කරන්නට මහන්සි වියැ යුතු නො වේ. එය සිතින් කළ යුත්තේ මෙ සේ යි. 4යි, 9යි එකතු කැර එන 13 දෙසැ බලා ඉදිරියෙන් ඇති එකේ ඉලක්කම නො සලකා හරින්නැ. තුනේ ඉලක්කමෙන් එකක් අඩු වූ විටැ එන දෙකේ ඉලක්කම පමණක් මතකයි තබාගන්නැ.

එ විටැ, 4යි, 9යි එකතු කළ විටැ එන 13 දෙසැ බැලූ සැණින් දෙක යැ යි සිතියැ හැකි වේ. මෙය ඒ අනුවැ පුහුණු කළ විටැ 11ක් අඩු කරන්නට වැර වඩන්නට වුවමනා නැත. සිත මෙ සේ මෙහෙයැවීමට පුරුදු වියැ යුතු යැ.

5 යි, 8 යි = 13 යි —— 2
6 යි. 9 යි = 15 යි —— 4
7 යි, 7 යි = 14 යි —— 3
5 යි, 6 යි = 11 යි —— 0

එ විටැ, 13 දුටු මතින් දෙක යැ යි ද, 15 දුටු සැණින් හතර යැ යි ද, 14 දුටු මතින් තුන යැ යි ද, 11 දුටු විගස බින්දුව යැ යි ද සිතෙහි එක් සැණින් පහළ වේ.

දැන් අපි සලකමු නව පිළිවෙළ යොදන අයුරු. ගනිමු නිදසුනක්.

	4	5	6	8
		3	7·	9·
+	6	8·	2	5·
	9·	7·	8·	7
	6·	3	9	4·
	3	4	10	0
	2	2	2	3
	2 7	9	5	3.

මේ නිදසුනෙහි දී සිත මෙහෙයැවියැ යුත්තේ මෙ සේ යි. පළමුවෙන් එකු පිල (Units column) එකතු කරමු. එ විටැ;—

8යි, 9යි, 17යි ——> 6යි [9ට ඉහළින් තිතක් දමන්නැ]
6යි, 5යි, 11යි ——> 0යි [5ට ඉහළින් තිතක් දමන්නැ]

0යි, 7යි, 7යි ——> 7යි
7යි, 4යි, 11යි ——> 0යි [4ට ඉහළින් තිතක් දමා බින්දුව එක පිල යටැ ලියන්නැ]

දැන් දස පිල ගන්නැ;—

6යි, 7යි, 13යි ——> 2යි [තිතක් දැමියැ යුතු]
2යි, 2යි, 4යි ——> 4යි
4යි, 8යි, 12යි ——> 1යි [තිතක් දැමියැ යුතු]
1යි, 9යි, ——> 10යි [දස පිල යටැ මේ දහය ලියන්නැ]

ගන්නෑ සියක් පිල :—

5යි, 3යි; 8යි ——> 8යි
8යි, 8යි, 16යි ——> 5යි [තිතක් දමන්නෑ]
5යි, 7යි, 12යි ——> 1යි [තිතක් දමන්නෑ]
1යි, 3යි, 4යි ——> 4යි [සියක් පිල යටෑ මේ හතර ලියන්නෑ]

ඉක්බිති වෑ දහසු පිල ගනිමු :—

4 යි, 6යි, 10යි ——> 10යි
10යි, 9යි, 19යි ——> 8යි [තිතක් දමන්නෑ]
8 යි, 6යි, 14යි ——> 3යි [තිතක් දමා දහසු පිල යටෑ 3 ලියන්නෑ]

ඊළඟට කළ යුත්තේ තිත් ගණන එකතු කැරෑ 3 4 10 0 යන්නට යටින් ලිවීම යි, එකු පිලෙහි තිත් තුනෙකි, දස පිලෙහි තිත් දෙකෙකි, සියක් පිලෙහි තිත් දෙකෙකි, දහසු පිල යටතේ තිත් දෙකෙකි. එ බැවින්, 3 4 10 0 යටතේ මේ සේ ලියා ඉරක් අදින්නෑ.

3	4	10	0
2	2	2	3

අවසන් පිළිතුර ලබාගැන්මට දූන් කළ යුත්තේ මේ ලද පේළි දෙක එකතු කැරුම යි. එය ද කළ යුත්තේ වෙසෙස් පිළිවෙළකට යෑ.

	3	4	10	0
	2	2	2	3
2	7	9	5	3

මෙහි එකු පිල දෙසෑ බලන්නෑ, ඉහළෑ බින්දුව වෙයි; පහළෑ 3 වෙයි. පහළ ඉලක්කම වූ 3හි දකුණෙන් ඉලක්කමෙක් නැති. එ බැවින් පහළ ඉලක්කමට දකුණෙන් ඇත්තේ බින්දුව සේ සලකමු, එකතු කළ යුත්තේ ඉහළ ඉලක්කමත්, පහළ ඉලක්කමත්, එයට දකුණෙන් ඇති ඉලක්කමත් යෑ. එ විටෑ එනුයේ:—

$$0 + 3 + 0 = 3$$ යනු යි.

මේ යෑ පිළිතුරෙහි එකු පිලෙහි ඉලක්කම.

දූන් සලකන්නෑ දස පිල. පහළ ඉලක්කම වූ 2ට දකුණෙන් ඇත්තේ තුනේ ඉලක්කම යි. එ බැවින් එය එකතු කළ යුත්තේ මෙ සේ යි:—

$$10 + 2 + 3 = 15$$

මෙ සේ ලැබුණු 15න් 5 පිළිතුරෙහි දස පිලෙහි ලියා ඉතුරෑ එක සියක් පිලට එකතු කළ යුතු යෑ.

දූන් සලකන්නෑ සියක් පිල. එය එකතු කළ යුත්තේ මෙ සේ යි. දස පිලෙන් ඉතුරෑ වූ එකේ ඉලක්කම ද ඉහළ ඇති හතරේ ඉලක්කම ද පහළ ඇති දෙකේ ඉලක්කම ද එහි දකුණෙන් ඇති දෙකේ ඉලක්කම ද යන ලෙසිනි. එ විටෑ එනුයේ:—

$$1 + 4 + 2 + 2 = 9$$

මේ නවයේ ඉලක්කම පිළිතුරෙහි සියක් පිලෙහි ඉලක්කම යි.

දූන් ගන්නෑ දහසු පිල.

$$3 + 2 + 2 = 7$$

මේ හතේ ඉලක්කම පිළිතුරෙහි දහසු පිලේ ඉලක්කම යි. මෙ තැනෑ දී එක් වැදූගත් කරුණක් සිතෑ තබාගත යුතු යෑ. එ නම්, **එකතු කැරුම හමාර නැති වග යි.** මේ ඇයි? දස-දහසු පිල ද සැලැකියෑ යුතු යෑ. දස-දහසු පිලෙහි ඉහළ ඉලක්කම බින්දුව යි, පහළ ඉලක්කම ද බින්දුව යි. එහෙත් පහළ ඉලක්කමට දකුණෙහි ඇති ඉලක්කම දෙක යි. එ බැවින් එය මෙ සේ එකතු කළ යුතු:—

$$0 + 0 + 2 = 2$$

මේ දෙකේ ඉලක්කම තමා පිළිතුරෙහි දස-දහසු පිලෙහි ඉලක්කම. එ විටෑ අවසන් පිළිතුර සේ එනුයේ 2 7,9 5 3 යි.

මෙ කියැවූ ඔබට හැගි-යන්නට පිළිවනි මේ නව පිළිවෙළන් එ සේ මෙ සේ කාරියක් නොවන ලෙසින්. එ සේ හැමෙහනුයේ දිගට විසිතුරෑ කරන්නට වූ හෙයිනි. එහෙත් නිදසුන් දෙකක් තුනක් පුහුණු වූව ඔබට නිසැකයෙන් මෑ වැටැහෙයි මේ පිළිවෙළ ඉතා පහසු වගත්, ඉක්මනට එකතු කරන්නට ඉවහල් වන පිළිවෙළක් වගත්. මේ කියැවූ ඔබ, මින් ඉදිරියට යන්නට පෙරු, පහනෑ දූක්වෙන

ඇබෑසි පුහුණු වන්නෑ. තව පිළිවෙළකි රස විදියෑ හැක්කේ එ විටෑ යෑ.

ඇබෑසි

1.		2.		3.	
	4 7 8		7 2 2 4		2 1 9 9 9
	2 3 9		3 5 9		4 5 3
	9 5 6		1 3 8 8		3 0 8 7 8
	7 2 5		2 5 0 9		6 9 7 2 3
	3 1 2		3 0 6 8		8 4 0 8 2
	4 8 9		8 2 0 9		3 1 2 0 9
	6 7 7				

ලැබියෑ යුතු පිළිතුරෑ මෙ සේ යි:—

1.		2.		3.	
	2 0 2		10 4 10 3		0 4 8 9 1
	3 3 4		1 1 1 4		2 1 2 2 3
	3 8 7 6		2 2 7 5 7		2 3 8 3 4 4

ලැබුණු පිළිතුරෑ සරික්සීමේ (හරි බැලීමේ) පිළිවෙළ අනෝ ලිපියෙකින් එළි වෙයි.

★★★

“සිංහලය රජයේ බස වූ පමණින් සුබැසියන් ගේ යුතු කම් ඉම් නොදක්නේ යැ. මෙ රටැ රජයේ බස හෙළ්ව — සුපුදු හෙළ්ව වන තෙක් මැ සුබැසියන් ගේ කටයුතු දැඩි උත්සාහයෙන්, මහ හැකියෙන් දිරිමත් වැ කැරගෙනැ යා යුතු බව අපි දතුමු.”

—වීරශේඛර ජගත්

(සුබස)

දුහුන පබඳ

පින් කම

කාලිංග විජයවර්ධන

අද අපේ රටේ බොහොම යි, පින් කම්. එහෙත් මට පෙනෙන්නේ ඒවායින් වැඩියක් ම නියම පින් කම් නොවන බව යි.

අපේ සමහරු බෙර දවුල් ගසා මහ පෙරරින් මහ දන් දෙති. එහෙත් අසල ඇති දුප්පත් ගෙදර හාමතේ හඬන දරුවා ගේ හඬ ඒ ඇත්තන් ගේ කනට නම් වැටෙන බවක් පෙනෙන්නේ නැ.

ඇත්තට ම මේ නියම පින් කම් නො වෙයි. නියම පිනක් කිරීමට ඇත්නම් කො තරම් හොඳ දැ යි මට සිතුණු වාර එමට යි.

තමා දුක සේ උපයාගත් මුදලෙකින් දනක් දීමට ඇත්නම් ඉතා හොඳ යි. අර මහ සිළු මහ තිස් රජතුමා උක් හකුරු මෝලෙක කම්කරුවකු සේ වැඩ කොට උපයාගත් මුදලින් දුන් දන ගැන මට සිහි වුණා. එහෙත් කුඩා මට එ බඳු වැඩක් කළ නොහැකි යි. ගැමුණු කුමරා කැලැ වැදි උන් දිනවලැ බඩ ගින්නේ ඉඳගෙන දුන් දන ද උතුම් දනෙකි එහෙත් එයත් මට කළ නොහැකි යි.

ඊ ළඟට මට හිතුණේ හිඟන ළමයිනට දනක් දීමට යි. ළමයින් ම මගේ දන සඳහා මා තෝරාගත්තේ ඔවුනුත් මගේ වයසේ ම වීම නිසයි.

මගේ මේ අදහස තාත්තාට කිවා ම ඔහු කීවා එන පෝයට කතරගම දී එය කළ හැකි බව. ඒ ඇසීමෙන් ම මට ඇති වුණේ හරි ම සතුටෙකි.

එ ද එන්නේ කවර ද ද යි ඇඟිලි ගැණ-ගැණ යි මා උන්නේ. දවස ආවා. දැන් අපි කතරගම!

මැණික් ගඟෙහි නැ අපි පළමු ව සිරිත් පරිදි කිරි වෙහෙර වැඳ පුදගෙන අවුත් කතරගම දෙවියන් හට ඒ පින් දුන්නමු.

එයට පසු හිඟන ළමයින් පෙළට සිටැවූමු. ඒ පෙළේ කොන නොපෙනෙන තරම් දිග යි. අපි ගෙන ගිය කෑම් පොදිත් ඇඳුමුත් බෙදදෙන්නට වූමු. එතකොට ම පෙළ කැඩුණා. ළමයින් අවුත් අප වට කැරගත්තා 'මට දෙන්න, මට දෙන්න' යනුවෙන් කෑ ගසන්න වුණා. මේ කෑ ගැහිල්ලට ලොකු හිඟන්නනුත් එහි ආවා. එ තැන ඇති වුණේ මහ කලබලයෙකි. හරියට ම අර 'වැලිවිට සඟ රජ හිමියන් ගේ දන' ගැනත් මට මතක් වුණා. අපේ තාත්තා ඉදිරිපත් වී ලොකු හිඟන්නන් පැත්තකට කොට ළමයිනට පළමු ව දන ගන්න සැලැස්සුවා. එයට පස්සේ ලොකු හිඟන්නන් හටත් ඉතිරි ව තුබූ දේ බෙද දුන්නා.

අන් දී ඉවර වී අපිත් දවල් දන සඳහා ගියමු. දන් දීමෙන් ඇති වූ සතුට නිසා මට නම් කෑමෙහි ඕනෑ කමක් තිබුණේ නැ. මේ දන සිහි වන හැම විට ම තාමත් මට නම් හරි ම සතුටු යි.

දූංහිඳ ඇල්ල

සමන්ති අහුබුදු

හැලෙනවා, හැලෙනවා
දිය ඇල්ල හැලෙනවා!

1. බදුල්ලට ගිය ගමන්;
දූංහිඳත් බලන්නට
ගියොත් හොඳ යැ යි කියා
ඉතින් අප එහි ගියා.

හැලෙනවා, හැලෙනවා
දිය ඇල්ල හැලෙනවා

2. හැතැප්මක් දුර දී ම
අප ඇසට නො පෙනී ම
හෝ හෝ හෝ හෝ ගගා
සිනා හඬ නගනවා.

හැලෙනවා, හැලෙනවා
දිය ඇල්ල හැලෙනවා

3. තව තවත් පුදුමයෙන්
ඉදිරියට අප ගියා,
වංගුවක් පහු කළා
ඇල්ල අර පෙනෙන්නේ!

හැලෙනවා, හැලෙනවා
දිය ඇල්ල හැලෙනවා

4. වලා කුළු පාත් වී
කඳු මුදුන සිඹින සේ
සුදු පුළුන් කැටි ගොඩක්
නො කඩවා හැලෙන සේ-

හැලෙනවා, හැලෙනවා
දිය ඇල්ල හැලෙනවා

5. කඳු ඇලෙන් පල්ලමට
බහින අපි ගල් උඩින්
නො ලිස්සා යන්තමින්
ගොසින් දුටුවමු ඇල්ල.

හැලෙනවා, හැලෙනවා
දිය ඇල්ල හැලෙනවා

6. මහ යෝද දිය කඳක්
නට-නටා හැලෙනවා
ඉවරයක් නැති ලෙසින්
හැලෙනවා, හැලෙනවා

හැලෙනවා, හැලෙනවා,
දිය ඇල්ල හැලෙනවා!

7. මුළු පෙදෙස පිනිවලින්
පිරිලා වහිනවා,
පිනි පොදින් අප ඇඳුම්
තෙමාගෙන හැලෙනවා

හැලෙනවා, හැලෙනවා,
දිය ඇල්ල හැලෙනවා!

8. අපේ කැමරාවටත්
වැඩක් දිය යුතු නිසා
ඇල්ල පසු බිමට ගෙන
පින්තූර ඇරගතිමු

හැලෙනවා, හැලෙනවා,
දිය ඇල්ල හැලෙනවා!

9. ඇල්ල ළඟ ගල් උඩ ම
වාඩි ලා අපි හැවොම
අප ගෙනා පාන් පෙති-
වලට වැඩ හැදුවෙමු

හැලෙනවා, හැලෙනවා,
දිය ඇල්ල හැලෙනවා!

10. "ඉතිරි වූ පාන් පෙති
අපට ඕනැ" කියා
එහි පැමිණි රිලවුනට
දනක් දී පින් ගතිමු

හැලෙනවා, හැලෙනවා,
දිය ඇල්ල හැලෙනවා!

11. "දැන් ඉතින් යමු" කියා
යළි ගමන් ඇරඹුවෙමු
ගමන් අරඹා යළිත්
හැරිලා බැලුවෙමු

හැලෙනවා, හැලෙනවා,
දිය ඇල්ල හැලෙනවා!

12. බදුල්ලෙන් ගල්කිස්ස
බලා අපි පැමිණියෙමු
පැමිණ දූංහිඳ ඇල්ල
ගැන මෙ ලෙස කවි ලියමු

හැලෙනවා, හැලෙනවා,
දිය ඇල්ල හැලෙනවා!

ගෙයක් ගිනි ගත් වෙයි

බම්බලපිටියේ
විශාකා විද්‍යාලේ,
අනෝජා පෙරේරා

"අයියෝ 'අන්න ගෙයක් ගිනි ගන්නවෝ'"

මෙ හඬ ඇසුණේ පාර පැත්තෙනි. මම කවුළුවෙන් පිටත බැලුවෙමි.

මිනිසුන්, ගැහැනුන්, ළමයින් එක් පැත්තකට දිවෙනවා පෙනිණි.

එ විට වේලාව රෑ හතට පමණ ඇති. මුළු-තැන් ගෙයි වැඩෙහි යෙදුණු අම්මා ද ආත්තම්මා ද මේ කලබලයෙන් මිදුලට ආ හ. මම ද කියවමින් උන් පොත මේසය මත තබා මිදුලට දිව ආමි.

එ විට ම සීයාත් තාත්තාත් අර මිනිසුන් දිව ගිය අතට ම ලඟි ගමනින් ගියෝ ය.

"අම්මේ, මාත් යන්න ද?"

"හොඳ යි, අපිත් යමු බලන්න" මෙ සේ කී අම්මාත් ආත්තම්මාත් අපේ ගෙයි දෙර වසා මා ද කැටි ව පාරට බැස්සෝ ය.

ගිනි ගත් ගෙය වූයේ අපේ ගෙට ගෙවල් දහයකට පමණ එහා ය. සැණෙකින් අපි ද එහි ගියෙමු.

අප යන විටත් ඒ මුළු පෙදෙස මිනිස් හිස් ගොඩකි. සමහරු එහේ දුවති, මෙහේ දුවති, කෑ ගසති, "දිය ගෙනවු! දිය ගෙනවු!" යැ යි කෑ ගසති. අසල පහල සියලු ම පනිටවූ එ තැනට ආ සෑටියකි. මිනිස්සු දිය ගෙනෙති, ගෙනෙති, ගින්නට දමාගසති. එහෙත් ගින්නේ තිබහ එයින් නිවුණේ නැති. ඒ සූ සූ යන හඬ දෙමින් වහලින් මතු වී සිටියේ ය.

මේ අතරේ මිනිහෙක් ගේ ළඟ @ පොල් ගහකට නැඟී එහි අමු අතු කපමින් වහල උඩට දමන්නට වූ හ. එහෙත් ඒ අමු අතු ද කෝප වූ ගින්න පට පට ගාමින් පුපුරමින් පුළුස්සන්නට විය.

මේ අතරේ ම ගෙදර වූ බඩු මුට්ටු මිදුලේ ගොඩ ගැසෙනවා පෙනිණි. ගෙදර අය ගේ ද රැස් වූවන් ගේ ද විලාපයෙන් අසල මුදේ හඬ ද යට වුණා සේ විය.

මේ එක්ක ම පාර දෙසින් ඇසුණේ සීනු හඬෙකි.

"අයින් වෙයල්ලා ගිනි නිවන හමුදාව!"

මේ හඬින් පිරිස රියට ඉඩ දී අයින් වූ හ.

යකඩ තොප්පි ලාගත්, නිල් ඇඳුම් ඇඳ-ගත් නිලදරි පිරිසක් රියෙන් බැස්සෝ ය. ඔවුන් ගේ අතෙහි වූ නල මොහොතෙකින් සිය යුතු කම් ඉටු කරන්නට විය. එයින් හැර දිය කඳ විහිදෙන්නට විය.

යමා මහ පෙළහරින් බාගයක් නිලදරියන් දක්වන්නට වූ විට ගෙය දක්වමින් උන් ඉකිරි අඩ විකෙන් වික නතර වන්නට විය. ගෙවුණේ අඩ පැයක් පමණෙකි, දුන් ගින්න ආ ගිය අතෙක් නැති. අපි ආපසු ගෙදර ආවමු.

මොහු කවුරු ද?

මාතර,
කීර්ති නානායක්කාර

පැන පැන ගමනේ යෙදේ — වී
කුඩා සතුන් දක ගිලී — වී
වැස්ස දට නද කරා — වී
ගේ ඇතුළට පවා ඒ — වී

දුලි වළඳක් සේ පෙනේ — වී
හෙමින් හෙමින් ගමන් යා — වී
බය වුණ හොත් නතර වේ — වී
දිය ගොඩ එක සේ දකී — වී

මගේ බළපිටි සමය – 14

(ගිය කලඹ හා බැඳේයි.)

ගුරුදෙව්, කුමරතුඟු මුනිදසුන් බළපිටියේ ගුරු ඇබෑසි විදුහල් පති වැ විසූ සෙමෙකි එ විදුහලේ පුහුණුව ලද ගුරු කෙනකුන් වූ මෙ පබඳුවාණන් ගේ පසු ගිය ලිපිවලින් මුනිදසුන් පිළිබැඳි රසවත් පුවත් රැසෙක් මැ හෙළි වි. අද ලිපියෙන් ඇරැඹෙන්නේ ඉක්බිති එහි විදුහල් පති වැ පැමිණි රැ. තෙන්නකෝන් කිවිසුරාණන් පිළි-බැඳි රසවත් පුවත් යැ.

ගුරුදෙව් වියොව

මොහොට්ටි දෙණු දේවිදු

බළපිටියේ සිදුහත් ගුරු ඇබෑසි විදුහල ද එහි ඇතුළු වුවන් ගේ හද මැඳුරු ද එකතින් අලු කැරගෙනැ පැමිණි කුමරතුඟු මුනිදස ගුරු දෙව්යෝ, අප හැම ගේ හදවත් වියොවගින් අළු කොටැ මුළු සිදුහත් විදුහල මැ අඳුරු කෙරෙමින් ඔබින් අස් වැ ගියාහු යැ. මෙ පුවත තිර විසින් සැබෑ බව දන්නට ලැබුණේ, පෙරළා අප එහි ගිය පසු යි.

ගෙවුණේ 1929 අවුරුද්ද යි. 1930 ජනවාරියේ මුල් සතියේ එක් දිනෙකැ පස්වරුයේ අපි පෙරළා ඇබෑසි විදුහල් වනුමු. මසක් පමණ කල් රැජැයූ පාළුව නිසා, පණ ගසන්නට වන් නමුදු විදුහල සැබැවින් මැ මුළුමනින් අඳුරු යැ. පෙණෙන තාක් තැන් තන්හි වග-වග වැ හිඳැ මුමුනන්නවුන් ගේ මුහුණු ද අඳුරු යැ. හද මැඳුරේ පහන් නැති බැවිනි. එ සේ බෙණෙනවුන් හැම දෙන මැ ගුරුදෙව් කුමරතුඟයන් ගේ වියොව ගැනැ මැ යැ බෙණෙනුයේ.

මම කුමාරතුංගයන් නිසා මැ බළපිටි ගුරු ඇබෑසි විදුහල පැතූවෙකිමි. ඔවුන් නිසා මැ එහි පැමිණියෝ තවත් සිටියාහු ද යනු මම නම් නො දනිමි. ඇතැම් විටැ එ අදහසින් මැ පැමිණියවුන් තව ද සිටියා වියැ හැකි යි. ඒ කෙ සේ වෙතත් ගෝලයන් ගේ සිත් තදින් හැඳු-ගත් ගුරුවරයකු වෙත් වැ යෑමෙන් නැගි සොව එ ද කා ගේ මුහුණුවලැත් පිළිබිඹු වැ පෙනිණ.

'දැන් ඉතින් කුම් කෙරෙමු ද'? යි එක් රැස් වූ වැඩි දෙනෙක් කතිකා කළ හ. ගුරු වියොව තදින් දැනුණු කිහිප දෙනෙක් "අපිත් අස් වැ යෙමු" යි කී හ. "එ සේ නිකම් මැ අස් වැ යෑමට නම්, ආයේ කුමකට ද?" යනු කියා, අස් වැ යෑමේ අදහසට හරස් වැ සිටිය හ. සමහරෙක් තවතවත් කළ හැකි නොකළ හැකි නානායුරු සැලැකැවීම් ඉදිරි පත් කළ හ, ඇතැම් කෙනෙක් එ බඳු මොහොතෙකැ සබෑ විසින් ඇති වියැ හැකි හද වෙයින එ හැම දෙනා ගේ අදහස්වලින් මොනොවට කැපී පෙනුණේ යැ.

විදුහල සතු මුළුතැන් ගෙය ද දූන්-දූන් පණ ගසනු පෙනේ. මුළුතැන් නාවා පැමිණෑ අප සැයි නාවන් හමු වැ කිසිවක් බෙණෙයි. ඒ අපට නො ඇසුණු පමුත් කරුණු වටහාගතුමු. සැසි නාවෝ තළාව පිඹියහ. අපි බොජුන් හලට ගොස් පස් වරුයෙහි ලැබෙන තේ විත බී පෙරළා අවුත් පළමු හුන්-හුන් තැන්වලැ මැ ඇඳි-ගතුමු. ඇඳි-ගෙනැ යළි දු කතාව පටන් ගතුමු. වැඩි වීසින් කතා කැරුණේ කුමාරතුංගයන් ගේ වියොවින් අපට වූ පාඩුව ගැනැ මැ යැ.

පස් වරු හතරට පමණ ඇති දුන් වේලාව මුහුදු බඩ මැ හෙයින් හොඳට හිරු එළිය ඇති ගාලු පාරේ අ... විදුහල දෙසට හැරුණු සරවු-වෙක් (මෝටර රියෙක්) එයි. ඒ හැම දෙන මැ හඳුනන රියෙකි. "ලෝඩ්", "ලෝඩ්" යනු කිය-මින් හැම දෙන මැ තම-තමන් ගේ බස් නැවැතූ හ. "ලෝඩ්" යනු ගරුමුනි රොබත් ද සොයිසා සූරින් හැඳින්වි බළපිටියේ වැඩි දෙනකුන් එ කලැ වහරන ලද කෙටි නම යි. ඔවු, එහි ආචාර් විදුහල්හි අදියුරු තැන් පත්, රොබත් ද සොයිසා සූරිහු යැ.

රියෙන් බට ඔහු එක් ඇසෙකැ පමණක් උපනෙතක් රඳවමින් අප ඉදිරියට ආ හ. ඔහු එ කලැ කුමාරතුංගයනට වඩා වයසින් වැඩි යැ. උස මහතින් නම් දෙ දෙනා ගේ වෙනසක් නැති තරම්. ඔහු සැයිනාවත් බැණැවූ හ. වෙයින් ඉදිරියට ගොස් ඔවුන් හමු වූ හ සැසි නායෝ. එ කලැ එහි එ තනතුරට පත් වූවෝ, තොටග-මුවේ (D. S.) ද සිල්වා නම්මු යැ. (අද ඔහු විදුහල් පතිවරයෙකි.) දුනුමෙන් කෙ සේ වෙතත් උස මහතින් ද සවියෙන් ද අන් හැම දෙන පරයා සිටි හෙයින් ඒ තනතුර ඔවුනට පැවැරිණ. අදි-යුරුවෝ එ බව දනිති. තැනැති විසින් ද හඳු-නති. "සිල්වා, සියලු මැ ළමයින් කැඳවන්නැ සාලාවට." යනු අදියුරුවන් කියන්නා හා මැ සැසි නායෝ තළා පිඹිය හ. අපි හැම දෙන මැ තළා අඬින් සාලාවට ගොස් තම-තමන් ගේ අසුන්වලැ හිඳැ-ගතුමු.

අදියුරුවෝ හල තුළට පිවිසිය හ. අපි හැම දෙන මැ නැඟී සිටැ ඔවුන් පිළිගතුමු. ඉක්බිති අපි හිඳැ-ගෙනැ මැ ඇසුමු. ඔවුන් නො හිඳැ මැ දෙසූ මෙ බස්.

> "කුමාරතුංග මහත්මයා අස් වී ගිය බව මේ ළමයින් හැම දෙනා ම දැන් දන්නවා ඇති. උන්නැහේ ගේ යෑම ගැන මේ ළමයිංට වගේ ම මටත් බොහො ම කනගාටු යි. උන්නැහේ අස් වුණේ උන්නැහෙ ගේ ම ඕනෑ කමට, මගේ කීමකට නො වෙයි. මා නොයෙක් විදියෙන් කීවා, තව මාසයක් වත් නැවැතිලා හිඳැ යන්නට. කැමැති වුණේ ම නැ. උන්නැහේ ගෙ හැටි මේ ළමයින් දන්-නවා නොවැ? යමක් කිවුවොත් කිවුවා ම යි. ඉතින් මා කුමක් කරන්නට ද? ඉල්ලා අස් වීම බාරගත්තා."

එ විටැ අපි හැම දෙන මැ ඇසූමු 'අපට කවුරු ද'? යි

> "බය වෙන්නට එපා, හෙට උදේ හොඳ මහත්මයකු ඒවි, අම්බලංගොඩින්. ඒ මහත්-මයා හොඳ උගතෙක්."

නැ, නැ අපට කුමාරතුංග මහතාණන් වෙනුවට තෙන්නකෝන් මහතුන් මැ ගෙන්වා දෙන්නට යැ යි අපි අයැදැ සිටියමු.

> "හරි-හරි, මා තෙන්නකෝන් මහත්තයටත් ලියමනක් ඇරියා. තව ම පිළිතුරක් නැති නිසා මේ මහත්මයා තාවකාලික ව යි පත් කෙළේ. අද හෙට ම තෙන්නකෝන් මහත්-තයා හමු වන්නටත් යනවා. උඹලා බය වන්නට එපා. කොහොම ම හරි තෙන්න-කෝන් මහත්තයා ගෙන්වා දෙනවා. හෙට උදේ අම්බලංගොඩින් එන මහත්මයා ආවා ම ඒ මහත්මයාට හොඳට කීකරු ව ඉගෙන ගන්නට ඕනෑ. තේරුණ ද? හ්ම් මා යනවා ඉතින්."

යනු කියා ඔහු දත් එකතු කොටැ ආචාර කළ හ. (අප ආචාර කිරීමටත් පළමු එ සේ කිරීම ඔවුන් ගේ සද පැවැති පුරුද්දෙකි.) ඒ සමඟ මැ අපි දු නැඟී සිටැ ආචාර කළමු. ඔහු රියෙහි නැඟී සිය නිවෙස බලා ගිය හ.

"කොහොම හරි තෙන්නකෝන් මහත්මයා ගෙන්වා දෙනවා." අදියුරුවන් ගේ මේ කීම නිසා අපි මදක් සැනැසුණෙමහ. කුමාරතුංග මහතා-ණන් වගේ මැ අපි අදියුරුවන් ද හඳුනමු. ඔහු බැරි කම් නො හඳුනති. පොදු කටයුත්තකැ දී මුල් තැන ගැනීමට සැබැවින් මැ සුදුස්සෝ යැ. තුමූ මහලු පසට බර වුව ද කවර තරමේ කිසක් හමුත් තුරුණුවනුදු පරයා කිරීමෙහි එක'තින් සමත් වෙති. තැනැති සුදුසු නැණ, නොපසුබස්නා දිරිය ඈ පිරිමි කම් හුවා දක්වන හැම උසස් ගුණ-යෙක් මැ අනුනට බෙදන තරමට ඔවුන් ළඟැ නිදහස් වැ පවත්නා බඳු වැ පිරී සිටි.

එ බැවින් තෙන්නකෝනුන්, බළපිටියට කැඳවාගෙනැ ඊම ඔවුනට එ තරම් කාරියෙක් නො වේ. මේ නිසා මැ සැනැසුම් සුසුම් ලූ අපි එ දිනැ රෑ අහරින් පසු සුව සේ නිඳ-ගතුමු.

(එන කලබ හා බැඳෙයි.)

———//———

වි රු ස ම රු ව

ගල්කිස්සේ
සිරිමනී සුගතදාස

පුනගැයිය
සාහිත, සිප්, විදු, කලා නැණින් ලොව හෙළි කැර බැබැළි එ ද
දෘ බල පැ මහ හෙළ විරුවන් අපි සමරමු බැතිනි සද

1. හුදු හෙළ පරපුර සතු වුණු ඔබ ගේ
බලතර ඵඩිය නිසා
නිය අගැ රැස් ගෑ නැහැවූ පර නිරි—
දුන් ගේ කිරුළු එ ද
'දසහිස්' යන විරුදවලි ඉන් ලැබැ
කිතු ගොස් දස'තැ විද
බැබැළුණු ලකිසුරු රාවණ හෙළිඳුන්
සමරිමු අපි හැම ද

2. පුලතිසි කුලයට හුරු හෙළ අබිමන
කෙලෙසු විබිසණ ගේ
වරදින් සටනින් රම්දුන් සතු වියැ
මව් බිම සිහළ අපේ
මෙ සෝ ගින්නෙන් මුස පත් ලක් මව
ඳෙ නෙතින් හැළුණු ඉපේ
කඳුළැලි විලසින් කඳු හෙල් අතරින්
ගඟුලැලි අද ද හැලේ

3. පරපුර විජයිඳු අතු ගං සිංහල
නාම රැකි එ පඩු අබා
සොළියා සුන් කළ ගැමුණු, විජයබා,
දසෙන්, වළගම්බා
සුද්දන් ගෙන් හෙළ පොළොව පොහොර කළ
සීතාවකැ රජසී
ඇ මහ නර ඉසුරන් ලද ලක් මව
මුළු ලොවැ අග මෙහෙයි

4. සිරිසඟබෝ වැනි දහැමි කමේ අගට මැ
ගිය මහ නිරිඳුන්
කලා ලොවෙ කිරුළ ද ලද සීගිරි
කසුබු අබා රජිඳුන්
පෙරෙව් නැණින් අග වෙහෙර දේව් බඳු
හරි හෙළ වීර ළඳුන්
වතු දෝ ලොවැ වෙන කො තැනෙකැ, මද්දුම
බංඩා වැනි බිලිඳුන්

5. බස රස දෙස තෙ රුවන ඔප කරමින්
නුවණේ මහිමය පැ
පුලතිසි, දැමි, විදුසක්විති, දම්සෙන්
රාහුල, පැරකුම්බං
සරණංකර, දම්පල්, මුනිදස්, විරු—
සේකර ඇ අප ගේ
විරුවන් සමරිමු දෘ ගතියෙන් අපි
බැතියෙන් සිරස නමා.

SINHALESE THROUGH ENGLISH - 4

(COPYRIGHT)

By Munidasa Cumaratunga

Parts of Speech

In English we have no less than eight Parts of Speech, ie. Noun, Pronoun, Adjective, Verb, Preposition, Conjunction and Interjection.

All Sinhalese words are divided into two main classes.

1 Declinables
and 2. Indeclinables

Those words that admit Case Inflexions or Verb Inflexions are Declinables.

(1) පුතා, පුත්තු, පුතු, පුතුන්, පුතුට, පුතුනට
(2) බලා, බලති, බලහි, බලහු. බලමි, බලමු

Those that do not change, that is do not admit Inflexions are Indeclinables.

මෙන්, හා, හෝ, බලා, බලමින්

Declinables are again divided into two classes.

1. Nouns
2. Verbs

These are the only Parts of Speech that we have in Sinhalese.

1. Nouns
2. Verbs
3. Indeclinables

The eight parts of Speech in English are included in the three of Sinhalese.

1. Noun 2. Pronoun 3. Adjective	1. Noun
4. Verb	2. Verb
5. Adverb 6. Preposition 7. Conjunction 8. Interjection	3. Indeclinable

There should be no question as to the propriety of taking Nouns, Pronouns and Adjectives as belonging to the same class of words. In English where there is no declension or very little of it, there may be some meaning in regarding them as three different Parts of Speech, but in a language like Sinhalese so rich in methodical Inflexions it is simply nonsensical to divide one Part of Speech into three. Some nouns are used for naming, others to avoid repetition and the rest for differentiation. That is all. This is no reason for counting them as thtee different Parts of Speech,

There is one class of words called Nouns. Nouns are of three kinds.

1. Naming Nouns
2. Pronouns
and 3, Attributive Nouns.

Indeclinables will be dealt with later on. Now let us concern ourselves with only the Nouns.

Nouns have three Genders.

1. Masculine
2. Feminine
3. Neuter

The Gender of the Attributive Noun is the same as the Gender of the Noun of which it is an attribute.

It is wrong to say that Nouns have Numbers. It is the case Inflexion that has Numbers.

Case or Verb Inflexions are divided into two Numbers:

1. Singular
2. Plural

Masculine and Feminine Nouns have four Cases. Neuter Nouns have two more.

The four Common Cases are

1. Direct (Nominative)
2. Oblique (Objective, Agential & Possessive)
3. Dative
4. Vocative

The two Neuter Cases are

1. Ablative ('with' or 'from')
2. Locative

Masculine and Feminine Nouns do not take Neuter Case Inflexions.

The Cases will be numbered as:

First	(Direct)
Second	(Oblique)
Third	(Dative)
Fourth	(Vocative)
Fifth	(Ablative)
Sixth	(Locative)

Let us decline a few nouns.

පුත් son, Masc.

	Sing.	Plu.
1,	පුතා	පුත්තු
2.	පුතා	පුතුන්
3.	පුතාට	පුතුනට
4.	පුත	පුතුනි

දෙන් cow, Fem.

	Sing.	Plu.
1.	දෙන	දෙන්නු
2.	දෙන	දෙනුන්
3.	දෙනට	දෙනුනට
4.	දෙන	දෙනුනි

Note

1. Masc. and Fem. Case Inflexions are the same in the P!u. Number.

2. The Long Vowel of the Sing, Masc. Inflexions is shortened in the Fem.

1.	පුතා	දෙන
2.	,,	,,
3.	පුතාට	දෙනට

Let us compare these with the nonsense now being taught in schools where the teachers of the old school are doing all they can to make the Sinhalese lesson most illogical and disgusting.

	Sing.	Plu.
ප්‍රථමා First	පුතා	පුත්තු
කර්ම Objective	පුතා	පුතුන්
කර්තෘ Agential	පුතා විසින්	පුතුන් විසින්
කරණ Instrumental	පුතා කරණ කොට (ගෙන)	පුතුන් කරණ කොට (ගෙන)
සම්ප්‍රදාන Dative	පුතාට	පුතුන්ට
අවධි Oblative	පුතා ගෙන්	පුතුන් ගෙන්
සම්බන්ධ Possessive	පුතා ගේ	පුතුන් ගේ
ආධාර Locative	පුතා කෙරෙහි	පුතුන් කෙරෙහි
ආලපන Vacative	පුත	පුතුනි

Can anything be more foolish than to regard phrases of two, three or four distincly seperate words as inflected Nouns.

Phrase	No. of words	Eng.
පුතා විසින්	2	by the son
පුතා ගෙන්	2	from the son
පුතා ගේ	2	of the son
පුතා කෙරෙහි	2	in the hand of the son
පුතා කරණ කොට	3	making the son the cause
පුතා කරණ කොට ගෙන	4	do

Poor innocent children are made to learn by heart long lists of such foolsh trash even in the highest of Colleges by teachers holding high University degrees. Nine Cases where there are only four ! Children's difficulties are thus increased by 125%. What for ? To shield the ignorance of the teacher.

What fools must the Englsh Grammarians be not to decline the English Nouns too in the same way and claim to have nine cases in their language also. Let us decline the noun **man**.

	Sing.	Plu.
First	man	men
Obj.	man	men
Agent.	by man	by men
Inst.	on account of man	on account of men
Dat.	to man	to men
Abl.	from man	from men
Poss.	of man	of men
Loc.	in man	in men
Voc.	man	men

That men said to be well-educated in English are not ashamed to teach innocent children such an absurd declention in Sinhalese must be owing to some sin committed by the Sinhalese children in a previous birth.

Just see how the cases are named. ප්‍රථම **first,** කර්ම **objective,** කර්තෘ **agential.** Why on earth is the First Case too not given a name according to its function? If that should be named according to the order why not the others? Simply because one misguided man happened to commit a foolish blunder why should the others follow him. If one is the first the next in order must be the second. A man who introduce nine men as the First, John, William, Solomon etc. must be given his proper place in a lunatic asylum. Should not the Principals of Colleges enquire whether there be any such men in their staffs?

[THE HELIO Vol. I No. 5]

සෙනසුරු දසාව

උණවටුනේ
අනඳ විජයරුවන්

හඳේ ගන'දුර දුර'ට එළි පෑ පහන නිවිලා පෙරළුණා
ගලා බට හුණු තෙල් වැකී හැම තැන මැ මගෙ ගත රතු වුණා
කොහේ යන්න ද කියා නො පෙනෙයි අහෝ මා වල් මත් වුණා
පියෙවි ලොවැ යළි පා තබන්නේ එක දිනෙකැ ද? මා තනි වුණා

රුදුරු දිව නිසි අහර නො දකැ යි අහර පිසී තව තව වවන්නේ
එයට සැනැසුම දෙන්න නො මැ හැකි නිසයි හදවතැ ඉපි ඇදෙන්නේ
පවන ගෙනැ එන නෙ පිනි කැට මුසු සිසිල ගිනි මැලය යි මවන්නේ
ගලන ඇස් ඉස්මෙන් මැ පමණ යි වියැළි දෙ තොලට පණ ලැබෙන්නේ

සතුටු බිජුවට තවාතෙන් මගෙ අතේ දුක් පැළ මැ යි නැගෙන්නේ
කටට ගත් බත් [කටට වැලි කැට සෙනසුරා මැ යි අහුරු ලන්නේ
සැනැසුමක් නැති ලොවේ කො තැනැ ද සැප යැ පැවැසෙන දෙය තියෙන්නේ
එ නැති හැම ද පාළු මෙ ලොවේ කුමක් පිණිසැ ද මා උපන්නේ

ගාල්ලේ මහින්ද විදුහලේ
සරසවි පිවිසුම් පෙළ.

අනුසසු වියොව

*එකියේ අනුසසු වෙල්ලාල ජයමහ මහ කිවියාණන්
1966 .10. 14 වැනි දිනැ සුර ලෝ වැඩියෙන් එකියේ
සොව මෙ සේ පළ වෙයි—*

ල ක් තුළැ කිත් දවුල කව කොවුලෙන් ලැව්යෙයේ
වි ක් මැති මහ බඹු ද මැවූමෙන් කැරුමැ වියෙයේ
කොක් ගලැ වෙල්ලාල ජයමහ ' මහ කිවියෝ
ද ක් වා දිවි අනිස අද සග සුව සෙවියෝ

බ ස ට වැඩ වැඩූ කවි දසැදහස් ලිවූ
අ ප ට එඩි කැවූ මීට මොළවා ලෙළැවූ
ඔ බ ට හුරු පුරත හුදු එඩි කදක් මැ වූ
මරු ට ගුරු සදිනි ඔබ එ ලෙස නො හැරවූ

අනුත් ගේ වැඩට කැප වූ මැ දිවියෙකි
තමන් හට යැ රැකි කිසිවක් නො කියැ හැකි
ඉතින් එ සේ රැකි නම් කිසි කලැ නො මැ කී
නිවත් මහ'නු යහ ගුණ සිල් මිණි වැලෙකි

ද රු ව න් නැති නමුදු ඔබ ගේ යැ කියැ හැකි
ද රු ව න් කොවැ දුය මැ සැලැකූ පිය තුමෙකි
එ හෙයින් ඔබ බසින් ලියතයෙනුදු නිසැකි
එ ලෙසින් ද ඇලුම් පළ වනු නුපුදුමෙකි

මු නි ද සු න් නොමැති සොව ජයතුන් වෙතිනි
එ ජ'ය තු න් නොමැති සොව කිවිසුරන් ගෙනි
කි වි සු ර න් නොමැති සොව පිය ඇදුරිඳුනි
ඔබ කෙරෙන් මැකුවමු දත් කිමැ ඉතිනි

ප ස් ම රු න් දිනු මහතුනට ද ලො දම්
ලෙස් මෙ ව න් විනම් අප ගැනැ කියනු කිම
ප ස් ක දි න් සැදුණු ඔබ අප සිරුරු මෙ ම
ප ස් ක දි න් මුසු වැ නො ගතෝතිනි පුදුම

ද හ ම මේ වුව ද එ දහම් දැනැ ද
ත ව ම අපි නැමෙවමු පුහුදුන් බැවින් සෙද
ප ර ම උතුරු සස නුවණැ'සිනි දුටු සඳ
ත ර ම මෙ බෙවේ වැටැහෙයි අප හට ද

වැ ටැ හෙ න තුරු එ බව නො ව්‍යැ වැටැහෙයි අපට
වැ ටැ හෙ න නුවණ එන තුරු අපි ඔබ ලෙසට
පෙ රු ව න වවමු යළි යළි ඔබ විත් අපට
ගු රු ව න සේ පතමු යන තුරු මැ නිවනට

මෙත්පලුවන් ගේ

'පද්‍ය සාහිත්‍ය විචාරය'

පළකැරුම - මීගමුවේ 'විජය පොත් පළ කරන්නෝ'

අද හතු පිපෙන්නාක් මෙන් තත් වගේ පත පොත බිහි වෙයි. එහෙත් වැඩි සරිය නො සැබි පත පොත බව පළ යැ. හොඳ පත පොත ගණිනුව අතැ ඇඟිලි ද වැඩි සේ යැ. දුන් දුන් සමහරැ තම පොත් වියපුරැව සරු කරනුව පාසල් පොත් අළලා විචිසු ලිවීමට පුරුදු වැ සිටිති. ලිපියුවා ගේ හැකියා මහිමය එ පොත් මැ මැනැවින් පවියි. මහ සරසවි ඇදුරකු ගේ "නූතන සිංහල පද්‍ය කාව්‍ය" යන පොත් දෙක එහි ලා නිදසුන් වෙයි.

එහෙත් මෙ වර දෙටු පෝදිසියේ ලිවිසැරිය සඳහා නියම වූ ගුත්තිලයටත් කුමාර පද්‍ය මාලාවටත්, මා. මෙත්පලුවන් අතින් විචිසුවක් සැටියෙන් ලියැවුණු "පද්‍ය සාහිත්‍ය විචාරය" ඉහතැ පැ අයුරින් වෙන් වීම සොම්නසට කරණු යැ.

විචිසුවාණෝ "කුමාර පද්‍ය මාලාවෙ විචිසුව තෙ කොටසකට බෙදති, මෙ සේ:

1. කිවියා පිළිබැඳි විතර
2. විචිසුව
3. පද ගැළ ළිහුම.

මෙයින් අපට වෙසෙසින් වැදගත් වන්නේ විචිසුව යි. නියම පැදි පෙළවල් තිහේ පියදස සිරිසේන, කුමාරතුංග මුනිදස, (B. H.) අමරසේන, ඩී. තෙන්නකෝන් (U.A .S) පෙරේරා හා චන්ද්‍ර-රත්න මානවසිංහ යන කිවියන් ගේ රැසැයුම්වලට ලියැවුණු විචිසු තරමක් සරු බව කිව යුතු.

විමලරත්න කුමාරගම ගේ "හුදෙකලාව" යන පැදි පෙළ විචිසන ඔහු මෙ සේ යෙති.

"ළය, මුව මෙන් ම ගොළු වූවත් මගෙ දූත
ඔබ සිහි කෙළෙමි ළහ ඇති ඇතේ ඇත

කිවියා රාත්‍රියේ සීතලේ (උණුසුමක් නැති ව) සිටි බව පෙනේ. කිවියා ගේ සිත - කට - අත් දෙක නිහඬ ව "කවුරු දෝ" සිහි කළ බව කියයි. ඒ සිහිකිරීම කවර අයුරින් කෙළේ ද යි නොරාගැනීම ගැටලුවෙකි." (73 පිට)

එහෙත් මේ ගැටලුවෙක් ද? "ළය, මුව මෙන් ම මගෙ දූත ගොළු වුවත් ළහ, ඇතක් ඇති බව සිහිකෙළෙමි" යනුයෙන් පද පිළිවෙළ ගත කිවියා යෙන්නේ සිය පෙම්වතිය ගැනැ බව පසක් වේ. ඇය නැති බැවින් කිවියා ගේ අහ-පසග ගොළු යැ. වසනු යේ ඇතැ බැවිනි. එහෙත් හදෙහි ඇය ඇති බව ඉන් නො හැගැවේ ද?

"ඉර පායා ඉර මුදුනට එන්ට එපා
සඳ පායා සඳ මුදුනට එන්ට එපා
දිවි, තරි, පිඹුරු කටකට කැප වන්ට එපා
අම්මා නැති අපට බඩ ගිනි වෙන්ට එපා

(යම්තම් බෙරුණා 82 පිට)

යන කවිය මැනැවින් ගළපා නැතිත් නැතට ඒ යොදන්නේ කරුණා රසය දියුණු කිරීමට විය යුතු"යි, කියත්, විචිසුවාණෝ.

එහෙත් කවිය මැනැවින් ගළපා නැති. මිනිසි මුවෙකින් කියැවියැ නො හැකි වදන් ද ඇති බැවිනි, එන්ට, වෙන්ට ඈ වදස් පිණිසැ සිටි.

(S.) මහින්ද හිමියන් ගේ "යුතුකම" නමැති පැදි පෙළට ද අප ඇස යොමු වියැ යුතු යැ. මට වැටැහෙන සැටි සරි නම් ඒ කවි නො වේ, චැන්තැවෙකි.

"කුල මල උගුල් අටවන බොරු බණක් පපා
තිලදරින්ට විස්වාසය දෙන්ට එපා"

යනු විමසන්නේ යැ.

විචිසුවාණන් පවසන සැටියට අදිරද වැද්දන් යටතේ වීසූ ගැමියන් උදෙසා ලියූ කවි පෙළක් බව පිළිගත හැකි වුව ද එ ද කිවි බසින් පැවැසීමට කවර සණෙසක් ද? "වියරණය ගැනැවත්, කවි ලකර ගැනැ වත් සලකා නැති. තම අදහස වේගවත් ව ඒ හැටියට මැ ගැමියන්ට පවා වැටැහෙන බසින් පවසා ඇති. ඒ මහින්ද රචනා වලැ ඇති විශේෂත්වයෙකි." (37 පිටුව)

විචිසුවාණෝ එ මැ පබඳ තව දුරටත් විචිසමින් මෙ සේ පවසන්නෝ යැ. එ සේ නම් මිහිඳු හිමියන් ගේ පැදි පබඳ උසස් බෙවින් තොර යැ. වියරණය හෝ කවි ලකර හෝ නො සැලැකීම නොවැ ෙහය? වියරණය නො සලකනවා නම් ගැමියනට වැටැහෙන්නේ කෙ සේ ද? විචිසුවාණන් එකකට එකක් විරුදු අදහස් දක්වීම දුබුල් බව නො වැ නොසැලැකිලිමත් බව පා යි.

එහෙත් ගුත්තිලය පිළිබැඳි වැ කැරෙන විචිසුව මෙයට වඩා සරු යැ යි හැඟේ. "ගුත්තිල කව් රස පහදුව," "ගුත්තිලයේ කාව්‍යාලංකාර" "ගුත්තිලයේ කව් පෙළහර" හා "ගුත්තිලයේ සමාජ දක්ම" ඈ නන් මැයින් යුතු පිරිසිඳි හදෑරුවනට ඉතා වැඩදයක යැ. වෙසෙසින් මැ "කව් රස පහදුව" සඳහන් අදී. අනු මැය දහයක් යටතේ විසිතුරු වැ 'විමසු ඇස' යොමා ඒ කැරෙයි. නන්රසයනට ගුත්තිලයෙන් නිදසුන් දෙන අයුරු ද මැනැවි. "කව් පෙළහර" සඳහා වෙසෙසින් සැණකෙළි වැනුම ගෙනැ විතර කළ සැටි අගී මැ යැ.

එහෙත් සමහර කවිවලැ පද බෙද ඇති අයුරු හොබිනේ නො වේ. පිළිවෙළෙකින් තොර යැ.

"රන් දද නෙලෙන් සැඩ
කෙරෙමින් වලා කඩ කඩ
රසින් ගණඳුරු මැ ඩ
අසා දිවැ එන රනෙහි සක් හඩ"

මෙ වන් නිදසුන් බොහෝ යැ.

අවසනැ යොද ඇති ඇබැසි පැන පනහ ද හදරුවනට විපුල පල ගෙනැ දෙන බව කිව යුතු.

මෙ වන් සුළු දුබුල් කම් ඇරුණු විටැ "පද්‍ය සාහිත්‍ය විචාරය" උසස් ගතක් හැටියට හැඳින්වියැ හැකි යැ. නවමුවකු ගෙන් බලාපොරොත්තු නො වියැ හැකි හැකියාවක් මැ දක්වෙයි. උසස් විචිසුවකු වීමේ පින මෙත් පලුවනට ඉඳුරා ඇති බව මින් මැ පෙනේ. උන් ගේ හැකියාව හෙළ තෙ රුවනේ හිත වැඩ පිණිසැ මැ වේ වා!

—අමරසිරි පොන්නම්පෙරුම

"කාටත් යා හැකි' යැ යි කී කලැ 'කාටත්' යනුයෙන් ගැනෙන්නෝ යැමට සුදුසු කම් ඇත්තෝ යැ. පා නැත්තෝ ද, බුත් කොඳු ඇට ඇත්තෝ ද, අඩයෝ ද, එ බඳු නුසුදුසු කම් ඇති අන්‍යයෝ ද නො ගැනෙති. 'කාටත් වැහැරැවියැ හැකි භාෂාවක්' යැ යි කියත හොත්, එ තන්හි 'කාටත්' යනුයෙන්, භාෂාවක් ශිෂ්ට වියැ යුතු යැ, නීත්‍යනුකූල වියැ යුතු යැ, ප්‍රබල විය, යුතු යැ' යි සලකා ගත හැකි වැටැහීම් ඇත්තෝ මැ කියැවෙති. සෙස්සෝ නො කියැවෙත්. එහෙත් දත් ඇතැම්හු, 'අප්‍රිකාගෙන් ඊයේ පැමිණි කාපිරියකුට ද පහසුයෙන් තේරුම් ගත හැකි වන සේ සිංහල භාෂාව ලිහිල් කළ යුතු යැ' යි කියත්." [*කුමරතුඟු මුනිදස්*]

පහඳුව

අනුරාපුර, රජයේ මහ ගිලන්හලේ, සිරි ජයමාන්නයෝ ඉංගිරිසි වදන් ඉද්දක් එවමින් එයට හෙළ වදන් පතති. ඔවුන් ගේ ඉංගිරිසි වදන් හා මැ අප සලකවන හෙළ වදන් පහතැ දක්වෙයි.

1. ඉංගිරිසියට සිංහලය

Boiler — පස්වනය
Boil — පස්වයි
Boilerman — පස්කුරු
Bed - Table — යහන් මැස්ස
Over Bed - Table — හිවියහන් මැස්ස
Bed - Block — යහනඩය (යහන්+අඩය)
Bowl — වටපය
Colander — පෙරහන් ගොටුව
Clip — අවුණනය
අවුණුව
File — ඇවිණිය
Carving Knife — කැට පිහිය
Chess — දම්
Counterfoil — උපපත
Clinic — කිළොත (කිළි+ඔත)
Clinical — කිළොත්
Claim — ඩියැදුම (අඩි+යැදුම)
Claim — ඩියදියි
Dressing Table — සැදුම් මේසය
Fastener — අල්ලුව
Feeding Bottle — මෙනුව, මෙනිකරය
Feed — මෙනයි (මෙනි කරනවා-ගම් වහර)
Hot-Plate, Electric— විදුලි රත්තැටිය
Emmersion Heatler, Electric — කිඳවන විදුලි උණුකුරුව
Heat — උණුරයි (උණු+කුරයි)
Pulley — කප්පිය
Physician — වෙද
Soiled — කිළිටි
Safety Razor — සුරැකි දැළි පිහිය
Specialist — වෙසරද
Thermos Flask — තැපස් බදුන (තැප්+අස්)
Trolley — දක්කුව
Vase — ඉළාව
Bill — අයපත
Voucher — වැයපත
Cheque Book — කුඹුපත් පොත
Visiting Hours — සැරික්සු හෝරා
(සැරි+ඉක්සු) ඉක්සීම (බැලීම) සඳහා යන සැරි (සවාරි) සැරික්සු යි.

Ante-natal Clinic — පෙර-උපත් කිළොත
post-Natal Clinic — පසු-උපත් කිළොත
Malnutrition Clinic — මඳ පොෂණ කිළොත
Gynaecological Clinic — ගැනුරෝලතු කිළොත
Pre-mature Baby Unit — පෙර-මුහුකුරු බිලිඳු එකුව

2. අටෝරාසිය

'අටෝරාසිය' කියන්නේ එක්-සිය අටට ද? අට සිය හැට හතරට ද?

අපේ ගමේ එක් මතුරු දපන්නෙක් අටෝරාසිය යනු අට සිය හැට හතර සඳහා ද එක් මතුරු පොතෙකැ එන බව කියයි.

ඔබේ අදහස කෙසේ ද?

—විලියම් රාමනායක
හිකදලුපොතැ, හිරිපිටිය විදුහල

[අටෝරාසිය නම් අටක් උතුරු වූ හෙවත් උතුරාගියා වූ (වැඩි වූ) සිය යි. අට+උතුරා+සිය> අටතුරාසිය> අටෝරාසිය. එ හෙයින් ඒ එක් සිය අට යි. මතුරු දපිමේ දී ද අටෝරාසිය නම් එක් සිය අට මැ යි. —සසාසු]

3. සුදුසුතර වදන්

පහතැ දෙපනෙන වදන් වැලේ සුදුසුතර වදන් කිම?

ඇරැයුම, අරියුම, ඇරයුම
පිරිසුදු, පිරිසිදු
ඇය ගේ, ඇගේ
හිරැ රැස්, හිරැ රස්
කැරුම්, කෙරුම්
දනුමෙන්, දනුමින්

ඇ. ලොරන්සු රණසිංහ
කොංවිටකඩේ, ඇත්ගාල

[ඇරියුම — ඇරැයුම?

මෙහි 'අරිය' - ඇරියුම්හි (ආරාදනා කැරුම්හි) පවතු (ධාතු) යි. උම් යනු කිරියදුනු (කෘදන්ත) පස (ප්‍රත්‍යය) යි. අරිය+උම් > ඇරියුම්, ඇරියුම් + අ > ඇරියුම; ඇරියුම යන තන්හි එන රි යනු හං බැඳුණු ඉ යනු මුලින් ඇති ඇ යන්නෙහි රුවට යැමෙන් හෙවත් පෙර රු ගැන්මෙන් ඇරැයුම යනු ද වියැ හැකි. වතුදු "අනුරු සේ පියෝනත්" වමු නම් සුදුසුතර වනුයේ ඇරියුම යන්න යි.

පිරිසුදු -- පිරිසිදු

පිරිසුදු -- මෙහි පිරි යනු උපසග පදයෙකි. සුදු යනු නමි පද යි. පිරි+සුදු > පිරිසුදු > (පෙර රු ගැන්මෙන්) පිරිසිදු
එ හෙයින් පිරිසුදු, පිරිසිදු දෙක මැ නිවැරැදි යි. එහෙත් අරුත වියත් වැ කැපී පෙනෙනු විසින් බොහෝ වියත්හු පිරිසුදු යනු මැ යොදති.

ඇය ගේ — ඇගේ

ඇ යනු පියෙවිය යි. ගේ යනු විබත් පස යි ඇ+ගේ (ලුහු සන්දි නියරින්) ඇගේ යනු වෙයි. ඒ නිවැරැදි යි. ඇය යනු ඇ යන පියෙවිය එක් බස් විබත් පස ගෙනැ සිටුනා පරිදි යි ඇ+ අ > ඇය.

ඇය යන්නට ගේ යන විබත් පස වීමෙන් ඇය ගේ යැ යි ද සිටී. එ ද නිවරද යැ. ලිවීමේ දී ඇගේ යනු එක් වදනෙකි. ඇය ගේ යනු දෙ වදනකි.

රස් — රැස්

රස් යනු මුල් රුව යි. ඒ රැස් යනුයෙන් ද සිටී. දෙක මැ නිවැරැදි යැ.

කැරුම් — කෙරුම්

කර කැරුම්හි පවතු යි. කර+උම් > කැරුම් වෙයි. උම් පස වැටෙන විටැ පවතුයේ අ>ඇ බවටත් උ> ඉ බවටත් ඔ> එ බවට නැමීම නියර හෙයිනි.

මේ අනුවැ කෙරුම් යනු වියරණයෙහි පිහිට ලබතොත් ලබනුයේ 'කොර' පවතුවක් ඇති නම් පමණෙකි. එ වැන්නෙක් මෙ බසේ නො වේ. එ හෙයින් 'කෙරුම්' යනු අපපදයෙකි.

දනුමෙන් — දනුමින්

දනුම් යනු මෙහි කිරියදුනු (කෘදන්ත) පියෙවියෙකි. දන්+උම්> දනුම්.

උම් පසින් නිපන් මෙ බදු පියෙවි විබත් විසින් ගන්නේ ඉන් නො වැ එන් යන්න යි. දනුමෙන් යනු මැද සර ලොප් වැ ලැබෙන දන්මෙන් විනා දන්මින් යැ යි නොසිටියෙන් ඒ බව පෙනේ.

මේ අනුවැ දක්මෙන්, රැක්මෙන්, ගැන්-මෙන් බැල්මෙන් යනු මැ විනා දක්මින් රැක්මින් ගැන්මින් බැල්මින් යනු ද සවරදු සේ සැලැකියැ යුතු. —සඟසු]

ඌවේ පැමිණිල්ල

වි. ජ. මු. ලොකුබංඩාර

සාහිත ෂතියෙක් ගෙවිණි. මහ සෙනඟ මැද්දේ— මඟුල් බෙර සද්දේ— හක් ගෙඩි පුඹබා— ජය හඬ නංවා— පහන් දල්වා ඇරැඹුණු ඒ මහා සාහිත උළෙල නොමතක වුණත්, එය නිමවමින් රිරියගොල්ල ගරු ඇමැතිතුමන් කළ දෙසුම නම්, සාහිත්‍යයට ළැදි කමක් දක්වන කාටත් මතක ඇති. අද අප රට හික්මැවීම බාර ඒ ඇමැතිතුමෝ, ඇබෑ හෙළ උගතුන් හඳුනති; නිවැරැදි බස් වහර දනිති; හොඳ අදහසින් කරන විච්සුම් අගයති; නුරුස්සතොත්, ඒ, කඩාකප්පල්කාරි දෙස්]දක්ම යි. කමත් ගේ සගයන් ලියූ කබල් කුණු හරුප පොත්-වලට තැගි නොලැබීමෙන් දූකට පත් ඇතැමුන් සාහිත මඩුල්ලේ වැඩ පිළිවෙළ දෙසට ලක් කෙරෙමින් කළ ''හිස් හිස'' කටයුතු හෙළා දුටු එතුමෝ, සාහිත මඩුල්ල යන මඟ වැරැදි නම් නිසි මඟ දක්වන සේ ද උදක් මැ පැවැසූ හ.

මෙ තෙක් එකලා වැ, අප ගෙනැ ගිය හටනේ පෙරමුණේ සිටිත්, ඇමැතිතුමාණෝ. අප ගේ මෙන් මැ ඇමැතිතුමන් ගේ ද උදර අරමුණ කුණුහරුප පොත් උවදුර මැඩීම යි; නිවැරැදි හෙළබස් වහර වැඩීම යි; කැප්පෙටිපොළ වැනි උදර විරුවන් බෝ කිරිම යි. මෙ උතුම් අරමුණ පෙරදැරි වැ, බදුලු සාහිත සමුළුව දෙසැ හැරී බලමු.

හෙට්ටිආරච්චි විසාරදයන් වැනි රටක් වටනා පඬුවන් මෙ තරම් ඇතට කැන්දගෙනැ, දස් ගණන් සාහිත රසිකයන් ගෙන්නාගෙනැ කතිකා කෙළේ කුමක් ගැනැ ද? ඉමක් කොනක් නැති යුද්ද මැද්දේ, තෙරක් පරක් නැති කලබල අස්සේ හෙම්-බත් වී ගිය පිරිසක් ලොකු ලොක්කන් සතුටු කොටැ කීයක් වත් ලබාගන්නා අටියෙන්, කබල් බසින් කළ පුහු ඉස්තුතියෙන් හා එ වෙලේ සොම්නසක් පතා කළ කුණුහරුප පැදිවලින් ද ගහන ''ප්‍රශස්ති හා හටන් කවි'' ගැනැ යි. ඒ මහ වියතුන් ගේ අදහස වූයේත් ඒ පොත් ගණනින් මහත් වුවත්, සාහිත රසයෙන් හීන බව යි. ගණන ගුණයට වඩා සැලැකුම් ලැබූ හැටි!

අපේ මුතුන් මිත්තන් ගෙන් දිවා රෑ කො නෙකුත් ගුණ වැනුම් ලැබුවෝ, අබ මල් රෝනක් සා ද ඇඹුටක් ලුහුඬුවක් නැති, සියලු ගුණයට බඳුන් වුණු, තුන් ලොවේ පිදුමට සුදුසුතමයාණන් වූ ''බුදු හාමුදුරුවෝ'' යි. ඒ බව බුත්සරණය වැනි පොතක් කියවා බැලුවොත් පෙනී යනු ඇති. එ නමුත් සාහිත මඩුල්ල මගින් හුවා දක්වුණේ ඉන්-දියාවෙන් ආවා යැ යි කියන 'ප්‍රශස්ති' වගයෙකි.

අපේ හෙළ විරුවන් කඩු ගටා, දුනු නගා දිවි පුද කෙළේ හෙළ රැසත්, බුදු සමයත් බේරාගන්නට විනා විළි බිය දෙකට විරිදු හට-නෙක් නො වෙයි. තියම යුද වැනුම් දක්නට නම් බැලියැ යුත්තේ කව්සිළුමිණි කුස දව වැනි පොතුයි. එහෙත් අපේ පඬුවන් බදුල්ලේ දී කතා කෙළේ දුනු විල හටනේ ඇති කුණු හරුප වග-යක් ගැනැ යි. මුළු ගත්තොරුව හටන පොතේ මැ, ඇත්තේ හැටියට හටනක් ගැනැ ඇත්තෙත් එක මැ එක පැදියක් පමණක් බව සැලැකුව තේරුම් ගත හැකි යි, ඔය හටන් කවි උදේ හවස කියකියා සිටියත්, මේ රටේ දින ගින ගති නැති කිරීමට නම් පිටු බල නොවන වග.

රටට ආදරයක් ඇති කාගේ වුණත් ළය කාගෙනැ යන තරමට ගුණ දහම් අතින් පිරිහුණු තරුණ පිරිසක් ඇති මේ රටේ මහ ජන මුදල් වැය කරවා කළ යුත්තේ විළි රැකීමටත් නිහීන දින ගැති ගති නැති කිරීමටත් මං පෑදීම යි.

කො තරම් උත්සවාකාරයෙන් කළත් පිට කහගැනීම නම් පිට කහගැනීම යි. කො තරම් වියදම් කරවා කො තරම් මිහිරට ගැයුවත් මහ සබා මැද්දේ නළවා ලෙළවා කිව්වත් නොසැබි කවි නොසැබි මැ යැ. ගරු ඇමතිතුමන් ගිය වර කුරුනැගලෑ සාහිත සමුළුව ද දුන් පිළිත අනු වැ, කබල් සාහිත්තිය තුරන් කිරීමට නම්, නිවැරැදි හෙළ වහරට තැන් දීමට නම්, දීන ගති තුරන්දු කිරීමට නම්, කළ යුත්තේ මහ දවල් පාන් දල්වාගෙනැ, මාස ගණන් තිස්සේ ලියන ලද කතාවක් බලංගෙනැ මහ හයියෙන් රට හිනස්සන පල් බොරු පැවැසීම නො වෙයි. යම් කිසි කරුණක් පැහැදිලි කැරැගැනීමට පැනයක් නැඟූ විටැ වල් බූත දොඩවා ඇඟ බේරාගන්නවුන් ගේ කතා කො තරම් සවරද ද යතු ඒවා අවවු ගසා ඇති හෙයින් අමුතුවෙන් කිව යුතු නො වෙයි.

ඒ කතාවන්හි බස පිළිබඳ වැරැදි ගැනැ සබයෙන් නැඟුණු විමැසුම, අසා සිටියනට මතක ඇති. ඇමැතිතුමන් හෙළ බසටත් වියරණයක් ඇති බව, නිවැරැදි බස් වහරක් ඇති කබල් පත පොත තුරන්දම් කළ යුතු බව තේරුම් ගෙනැ ඒ සඳහා හොද සිතින් කටයුතු කරද්දී, සාහිත මංඩලය ඉංගිරිසියට මෙන් සිංහලයටත් වියරණයක් ඇති බවක් නො තකන සේ යැ. හ වැනි දෙසු (ගොඩකුඹුරේ මහතා ගේ කතාවෙ) කවරයේ ඇත්තේ "සිංහල" යනු යි. එහි ඇතුළතැ ඇස්තේ "සිංහල" කියායි. එහෙත් ආංඩුවේ විබාගවලැ දිත් "න ණ ල ළ" නැකෙත බව යි, පවසත්තේ. පස් වැනි දෙසුමේ 4 වැනි පිටුවෙ මහ පුදුම වචනයෙක් සඳහන් වේ. "ස්තෝත්‍ර" යනු යි. යන්තම් සකු බස දන්නවුන් ද ස්ත්‍ර දය විසුරුවන අදහසේ විනා පැසැසුම් අරුත්හි නොවැටෙන බවත්, ඒ සඳහා ඇත්තේ ස්තු දය බවත් දන්නවා ඇති. එහෙත් ඒ පොත පුරා මැ සඳහන් වන්නේ ස්තෝත්‍ර ගැනැ යි. එහි මැ 15 වැනි පිටෙන් පෙනෙන්නේ සාහිත මංඩලය වග කියැ යුතු මේ පොතේ නොහොත් යන්න සහ හෙවත් යන්න නිසි පරිදි යොද නැති බව යි. හැම තුලවත් කම් පට බස් වහරට පවවන ඊ නියා සාහිත්තිය දුවැත්තයත් උක්තයත් ආඛ්‍යාතයත් ගැනැ නිසි වැටැහීමක් නැත්තවුන් බව, රසයත්, භාවයත් අතරේ වෙනස නොදන්නා බව කියන්නේ හද පිරි සොවින් විනා පුහු උදමෙකින් නො වෙයි.

සාහිත මඩුල්ල මගින් 'ලංකාංඩුවෙ මුද්‍රිත' මේ පොත්හි කරුණු අතින් ඇති වැරැදි බෙහෙවි. ඒ කොයි පොතේත් සඳහන් වන්නේ හටන් ලිවිසැරිය ඇරැඹෙන්නේ කුස්තන්තිනු හටනෙන් යැ යි යනු යි. සාහිත මඩුල්ලේ අය වැරැදි කරුණක් ගෙනැ එ සේ නො විමසා කළ කී දෙයක් හරි ගස්සන්නට නො සිතත්. එක් දෙසුවකු කියන්නේ "(අ) වීල හටනේ" සඳහන් සල්ලාලයා පිළිමතලවුවෙ බව යි. අනෙක් කෙනකු එ තැනැ දී මැ පවසන්නේ ඒ සෙනරත් බව යි. මේ දෙ දෙනා මැ එක් පුඟුලෙක් ද, නැත් නම් සිහියේ දෙසක් නිසා වුණු වරදෙක් ද යන්නට ඔවුන් ගෙන් කෙළින් පිළිතුරෙක් නො ලැබේ. මෙ බඳු නොසැලැකිලිමත් වරදින් ගහන මේ පොත්වලැ මිල! ගරු ඇමැතිතුමන් ලාබට පොත් ලබාදීමේ උතුම් අරමුණින් මහ හටනක් කරද්දී, සාහිත මඩුල්ල මගින් සත විසි පහක් වත් නොවටිනා පොත විකුණන්නේ රුපියල බැගිනි. මේ විදියට නම් රජය මගින් පළ කැරෙන අර සිංහල පොත් රුපියල් දහයක් වත් නැති වැ දෙන්නට බැරි වෙයි. මේ පොත් කොල්ලය ගැනැ ඇමැතිතුමන් වහා විමසා බැලියැ යුතු යි. මට නම් පෙනී යන්නේ ඒ පොත් සිහිනි රුපියල බැගින් මිල කැර ඇත්තේ එක්කෝ ගරු ඇමැතිතුමන් ගේ වැඩ පිළිවෙළට සරදමක් වසයෙන්; නැත් නම් පොත් සාප්පු කාරයන් සමඟ කළ යටි කුට්ටු වැඩෙකි. ඒ සිහිනි පොත් හය රුපියල් හය නම් ඒ ඇත්තත් මැ පළ කළ ප්‍රශස්ති හා හටන් කව් පිළිබඳ අර මහ පොත කීයක් වෙයි ද?

ඒ තිබීයේ වා! සාහිත සතිය බදුලු පෙදෙසේ දී පැවැති හෙයිනි ප්‍රශස්ති හා හටන් කවි ගැනැ විමැසීමක් කරන්නට සාහිත මඩුල්ල අදහස් කෙළේ. එකක් නො බා කිව යුතු යි. බදුල්ලේ දී නො වැ, පිට රටැ දී පැවැත්තුවත්, අවුරුද්දකට වරක් එළැඹෙන මේ දිනය හෙළ ලිවිසැරියේ දියුණුවට තුඩු දෙන අයුරින් සාහිත රසය විඳීමට ඉඩ සැලැස්වීමට විනා, කොටස් කොටස් බෙදී ඇති රට තව තව බෙදන්නට ඉඩ සලසවන්නක් නම් නො වියැ යුතු බව යි. "ඌවෙ සාහිත පුබුදුවක්" ඇති කිරීමට පැවැත්වුණ ද, ඌවේ සාහිත කටයුතු පිළිබඳ කැරුණු එක් මැ විමැසුම

මුතියංගනයේ බාරකාර හිමි පාණන් පැවැත්තූ දෙසුම, කව්සිළුමිණි කුස දව මහ පැරකුම්බා රජතුමන් විසින් කැරුණු බවට නො බිදියැ හැකි දෙස් දෙමින්, රාවණ රජතුමන් කලැ සිටැ, බුදුන් දිවමන් දවසේ සිටැ බිත්තැත්තේ මිනිසුන් හොඳ හැදුණු පිරිසක් වූ බව පළ කෙරෙමින් පැවැත්තූ ඒ හරබර දෙසුම පමණක් අවවු ගස්සා ඇත්තේ කබල් කොළයේ යි. ඒ අගනා දෙසුම ඇතුළත් පොත් සිහිත්තට පමණක් යටත් පිරිසෙයින් 'කව–රයෙක්' වත් නැති. මේවා කා ගේ කෙ බඳු යටි–කුවවු වැඩ ද? ඌරෙව් මිනිසුන් කෙරෙහි යම් කිසි අබිමනක් පහළ කරන අටියෙන් සාහිත උලෙළ බඳුල්ලේ පැවැත්විණි නම්, ඒ පොත් සිහිත්ත වත්, නොමිලයේ බෙද දියැ යුතු වැ තිබිණි. අඩු මිලට පොතපත සැපැයීමට නො–මද වෙහෙස දරන ගරු ඇමැතිතුමනට අප පැමි–ණිලි කරනුයේ, ඒ පොත් සිහින්න සත පනහ ගණනේ වත් විකුණන මෙන් ඒ පොත කළ ගරු ධම්මක්ඛන්ධ හිමිපාණන් විසින් මැ වණ තිව යුත්තන් ගෙන් කො තෙකුත් ඉල්ලා සිටීනා ලද නමුත් එයත් රුපියල බැගින් මැ විකුණු බව යි.

හෙළ සඟයුව ගැනැ හැබෑ මැ ඇල්මක් දැනුමක් ඇති, හොඳ සිංහල ඔළුවක් ඇති මකුලොළුව සුරින් ඉහළ හෙළ ගී ගයා වයා ලද අත්දැකුමෙන් එ ද එළ කළ හරබර අදහස් ගැනැ විමැසුමක් කරත්තට මිනිත්තුවක් වත් කල් නුදුන් සාහිත මඩුල්ලේ බලවත්තු තැගි ලබා ගැනීම සඳහා පැමිණි හැබෑ උගතුන් හට මහත් අවමනක් කළ හ.

තුන් වේදය මුවග ලෙළවත්තා වූ ද, පෙර අපර දෙ දිගැ මැ බස් සයුරු කිමිදියා වූ ද, තිරුක්–කුරල් පොත "සිරි ගිය" නමින් හෙළ බසට පෙරළා ලද යසස් ඇත්තා වූ ද, චාරුල්ස් ද සිල්වා හෙළ මහ කිවියාණනට එ තරම් දුර බැහැර ගෙවා පැමිණි සිය දේවිය සහ දරුවන් ද කැටි වැ අසුන් ගන්නට ඉඩ නුදුන් නමුත්, බොහෝ හෙළ බස් මකුවන් හට මුල් පෙළේ ඉඩ තිබිණි. ගරු ඇමැතිතුමන් ඒ සා මුදලක් පිරිනමන්නේ, ඒ සඳහා එ තුමන් කාලය හා වෙහෙස ගැනැ නො පතා පැමිණෙන්නේ, සාහිතයට ළැදි පිරිසක් ඇති කිරීමේ පරම අරමුණින් වුවත් ඒ උතුම් පඩි වරු–නට වෙසෙසී අසුන් පැනැවීමක් වත් නොකිරීම බලවත් වරදෙකි. ඔවුන් හට ගමන් වියදම් තබා දුම්රිය බිල පතක් වත් නිකුත් නොකරත නමුත් සාහිත මඩුල්ලේ ලොකු ලොක්කන් හට මේ ඇත කඳුකරයේ සීත දෙස ගුණය ද ලබා හොඳ ගමන් වියදමක් ද ලබන්නට වර පැදිණි, නොදියුණු ඌරෙව් සාහිත උලෙළින්.

රටේ සාහිත කලා පිළිබඳ සැබෑ දියුණුවක් ඇති කිරීමට හැබැවින් මැ වෙහෙස දරන ගරු ඇමැති තුමෙනි, මානවසිංහයන් ගේ ඉහළ හැකි–යාවන් ගැනැ, තෙන්නකෝන් කිවිසුරාණන් ගේ පුදුම කිවියාව ගැනැ ඔබ දනිති. කුමරතුඟු මුනි–දසුන් කළ ඉහළ මෙහෙවර ද දනිත් මැ යි. ගයි–ගර වියරණයේ වැරැදි පුරා දක්වමින් කුමරතුඟු–වන් කළ විවිසු සුබස පුරා ඇතත් නුදුටු වන් වූ අපේ පංඩිතයන් හට, පසු ගිය ද පළ වූණු පරණවිතාන සුරින් ගේ වි සු මගින් වත් ඒ විය–රණය දිවමන් අපේ බසට නම් නො ගැළැපෙන බව පැහැදිලි වියැ යුතු යි. එහෙත් ඔවුහු අදත් ඒ බොරුව සිංහලයට පෙරළා රටේ පතළ කරති. එහෙත් තෙන්නකෝන් කිවිසුරාණන් විසින් ලියන ලද දහස් ගණන් කව් මේ නෙක් නොපළ වැ ඇති බව, පොත් රැසක් මැ සම්හර පොත් සමාගම් කාරයන් ළඟැ බව නො දකිති.

ප්‍රශස්ති හා හටන් කව් ගැනැ මහත් විමැ–සිලි නොකළාට, මේ රටේ සාහිත පුබුදුවක් ඇති කිරීම සඳහා විමැසිලි කිරීමට කො තෙකුත් දේ ඇති. සිගිරි ගී, කව්සිළුමිණ වැනි පොත් කාහ–ටත් ගොදුරු නො වෙතැ යි අත් හරිමු නම්, මහත් වෙහෙස දරා කරුණක් දෙකක් සොයාගත යුතු තරමට නිසරු ඒ හටන් කව් හා ප්‍රශස්ති–යෙහි වැඩි පුර මැ ඇත්තේ කව් නොවන හෙයින්, කවි හොයාගන්නට විදියැ යුත්තේ කවර වෙහෙ–සෙක් ද? සාහිතය කවුරුන් කෙ සේ කිවත් ජන සතු කළ හැක්කෙත් හෝ නො වේ. ඒ උසස් සාහිත පොත්හි රස සියල්ලන් හට මැ විඳිමට අමාරු නිසා තමා, සාහිත සති පවත්තමින්, සාහිත මංඩලවලට දස් ගණන් මුදල් දෙමින් රජය මෙ සා මාන්සියක් ගන්නේ. එහෙත්, ඔවුන් කරන්නේ පොදු ජන රිසිය උසස් කරනු වෙනුවට පහත් රිසියක් පොදු ජනයා කෙරෙහි ඇති කිරීමට තැත් දැරීම යි. පොදු ජනයාට පාසුයෙන් තේරුම් ගත හැකි, රස විඳියැ හැකි සීපද ගැනැ වත් හොඳ සැඳුවක් කිරීම තේ ද කළ යුතු වැ තුබුයේ?

නො පා ඕය ඇත්ත ඇති හැටි කියූ නිසා, ඒවත් වැ සිටි යුගයෙහි දී කිසි දු සැලැකිල්ලක් හෝ බුහුමනක් හෝ රජයෙන් නොලත් කුමාරතුංග මුනිදාසයනට ඔවුන් ගේ රටක් වටනා උසස් පතපොතට තැනක් නොදෙන්නට සරසවි තුන මැ තැත් දරන බව ඇමැතිතුමන් නොදන්නවා ඇති. ව්‍යාකරණ විවරණය, ක්‍රියා විවරණය, වීරිත් වැකිය වැනි පොත් නුදුටු අය ශාස්ත්‍ර පති උපාධි ලබමින් නිවැරැදි හෙළ බස් වහර නොදන්නා කරුමය නිසා, මහ සබා මැද්දේ 'පව්' වෙත්. මේ විදියට ඒ උසස් පතපොත කොන් කරතොත්, අනාගතයේ උගතුන් ද, නිවැරැදි බස් වහර හෝ, රස දැනුම හෝ නොලැබීම නිසා ඔවුන් ගේ ගුරුන් මෙන් මැ පල්ලම් බසිනවා සිකුරු යි. එයින් පොදුවේ වන්නේ මේ රටට පාඩුවෙකි. එ හෙයින්, කුමාරතුංගයන් ගේ පතපොත රට පුරා පතළ කැරැ හැරියැ යුතු යි. ඒවා විභාග සඳහා නියම නොකරන හේතුව විමසා බැලියැ යුතු යි. ගුත්තිල විචාර විචාරය විභාගයනට නියම කරන්නවුන් එය කදිමට විවිසූ "ගුත්තිල දැක්ම" කොන් කරන්නේ කවර වරදකට ද යි විමැසියැ යුතු යි.

තෙන්නකෝනුන් ගේ හැකියාව ගරු ඇමැතිතුමන් හොඳින් මැ දන්නා බව අපට නිසැක යි. මේ රටේ සරසවි එ තුමන් කොන් කරන්නට නැතක් තැන් ගත් හැටි ගරු ඇමැතිතුමෝ දනිත්.

ඉතින්, සාහිත දිනයේ දී විමැසීම සඳහා වත්, ඒ මහ වියතාණන් ගේ ලියැවිලි මැයක් නො කරන්නේ, සාහිත මඩුල්ලේ බොහෝ පංඩිතයන් ගේ නොදැනීම නිසා යැ යි කියමු ද?

සාහිත මඩුල්ල උංව පලාතට දක්වන සැලැකිල්ල, ඌවේ කිවියන් දෙ දෙනකු පැවැත්තූ අත් අකුරු දැක්මට කිසි උදවුවක් නුදුන් සැටියෙන්, ඔවුන් හට ඒ සඳහා සාලාවේ ඉඩ කඩ සැපැයූ හැටියෙන් ද අපි දනිමු. උපන් තෙකට සාහිත මංඩලයේ මහ උත්සව නුදුටු අපට හිතුණේ, කොළොම් පුරය වැනි පලාත්වලැ මහ ඉහළින් පැවැත්වෙන්නේ මෙ බඳු උත්සව ද කියා යි. ගරු ඇමැතිතුමන් කෙරෙහි අදහා, සාහිත මඩුල්ල නියි මග යොමන අදහස් ඇති උප්පටිපන්න ගුණයෙන් හෙබුණු "කළුකොදයාවේ" මාහිමියන් කෙරෙහි බැතියෙන්, හැබැ හෙළ බස අඳුනන අම්ටසිටි ගුණවඩු මහ කිවියාණන් ද, සාහිත මඩුල්ලේ සිටිනා බවක් ඇසුණෙන්, වැඩක් වෙති යි සිතා මෙ සේ අදහස් පළ කෙළෙමු. "ප්‍රශස්ති හා ජටන් කවි" යන මැය තෝරාගැනීම මට නම් පෙනී ගියේ විහිළුවක් ලෙසිනුයි. ඒ නිසා එහි වැරැද්ද දැක්වුවා මිසැ වයසින් තුමූ කළ අපේ වැරැදි නැති නිසා නො වේ. එ හෙත් අර රජතුමා ගේ අගනා ඇඳුම නිකම් බොරුවක් බව පෙනුණේත් පොඩි ළමයකුට වූ!

පැබැඳුම් තරඟය

පැදි

මැය - ගං වතුර කළ විපත

ගැදි

මැය - බසේ බලය

(මෙබේ පබඳ නොවැම්බර 15 ට පෙර එළියේ සකසුවන් නමට එවුව මැනැවි.)

කොළොංබු හෙළ හවුල

සිරි බුදු වසින් 2510 නිකිණි පුර අටවක ලත් කුජ දිනැ (1966. 8. 23) සවසැ 3 30 ට පළමු වන මරදානේ ඔව්විගල හලෙහි මුළු දුන් කොළොංබු අතු හෙළ හවුල් මහ මුළුයේ සැකෙවි සැළය යි මෙ.

එ දිනැ පැක්ම අනුවැ කොළොංබු හෙළ හවුලේ සකසුරු අනඳපිය කුඩාතිහියන් විසින් මුළු නයු අසුන් පිළිගැන්විණ විදුදය සරසවි වැදුරු විනි විතාරණ සූරීනට. අනතුරු වැ, පැමිණැ සිටි පිරිස දෙස්මෙකින් සගත් හ කොළොංබු හෙළ හවුලේ සම සකසුරු සිටිනාමළුයේ සුමනරුවන් හිමිපාණෝ. අරියසෙන් අහුබුදුවන් ගේ සකසුරු බැවින් කොළොංබු අතු හෙළ හවුල 'මායා රටැ හෙළ හවුල් බල මඬුල්ල' නමින් මුලින් මැ ඇරැඹුණු බව ද, කලක් නිහඬ වැ තිබී යළි දූ වෙ. ම. පෙරේරා සූරීන් ගේ මෙහෙයුම් ලැබැ 1963 මැයි මසැ 25 දිනැ නැවැතැ පණ ගැන්වුණු බව ද, අවසන් වරට එ සේ පෙළැවුණු අතු හෙළ හවුලේ රණවැල්ල සූරීන් විසින් 'රුහුණු-මාගම් පුරය' මැයින් දෙස්මක් කළ බව ද, කොළොංබු හෙළ හවුලේ යටගියාව සැකෙවින් දක්වමින් කී හ පිළිගැන්මේ දෙසුම කළ ඒ හිමිපාණෝ.

නව සකසුරුවකු පත් කැරැගැනීම පැක්ම අනුවැ ඊ ළඟැ කිස වී. සිටි-සකසුරු අනඳපිය කුඩාතිහියෝ තමන් මහ හෙළ හවුල් සකසුරු තන්හි සිටුනා බැවින් එ කටයුතු බරින් මිදිකී සිටුනා තමනට අතු හෙළ හවුලේ සකසුරුවන් හැටියට ද කටයුතු කරන්නට ඔවස් මඳ බව පැහැදිලි කොටැ, නව සකසුරුවකු පත් කැරැගැනීමේ ඇවැසියාව පවසා තමන් ගෙන් හිස් වන එ තැනට කලණරුවන් සුමනදසුන් ගේ නම ද සැලැකැවූ හ. ඒ නම ධනපාල වීරසිංහ සූරීන් ගේ නිරැයීමෙන් සබයේ එක් සැඳින් පිළිගැනිණි.

එ දිනැ වෙසෙසි දෙසුම වූයේ වරකාගොඩැ ඥාණරුවන් පඬි හිමිපාණන් ගේ 'අපේ සාහිත්‍ය දර්ශනය' මැයින් යුතු දෙසුම යි.

දෙස, බස, රැස යන හෙළ තෙ රුවන තැංවීමට ගුරු දෙවි කුමරතුහු මුනිදසුන් පැ මෙහෙහි ගමන් කරන හෙළ හවුලට, බිය වීමට කිසිත් හේතු නැතැ යි පැවැසූ එ හිමියෝ ස-බස් පරම්පුරන් ගේ දුව ද වරද නම් වරද මැ යි පැවැසූ කුමරතුහුවනට උගතකු, ගුරුවරයකු හැටියට නො වැ, දෙවියකු හැටියට මැ ගරු කරන බව කී හ. 'අපේ සාහිත්‍ය දර්ශනය' පැහැදිලි කළ ඒ හිමිපාණෝ ලිවිසැරිය කලාහුරු වීමට දැමුණු බවත්, සුදුසුතාවත්, විසිතුරු බවත්, රසයත් ඇති වන සේ ලිවියැ යුතු යැ යි පළ කළ හ.

ඉක්බිති එළැඹි පැන විටෙහි දී වියරණ නය රක්නට යැම නිසා ඇතැම් පබඳක් සැමැනි විසින් නොරස වන අතර, එ සේ වියරණ නය රක්නට නොයැම නිසා ඇතැම් පබඳක් රසවත් වන බව ද පැවැසූ අයෙක් ලිවිසැරිය කලා කිසක් වීමට වියරණ හුරු කිරීම ඇවැසි මැ වන්නේ දැ යි පුළුවුත් හ. වියරණය නිසා රසවත් දැයක් නො රසවත් ද, නොරසවත් දැයක් අලුතුයෙන් රසවත් ද නොවන බව පැවැසූ හ දෙසුවාණෝ. වියරණයෙන් සැලැසෙනුයේ කිසිවක් නිරවුල් වැ තේරුම් ගැනීමට පිළිවන් වීම යැ යි ද වියරණයෙන් තොර පැවැසුම්හි අවුලින් බර තේරුම් බව ද තව දුරටත් පැවැසූ හ ඒ හිමිපාණෝ.

අන්දරයෙකැ ගන්මින දෙ-බස්හි වියරණ හුරුව පිළිබඳ මුළුනයුවාණන් විසින් ද පැමිණැ සිටි වෙනත් සැබියන් විසින් ද අදහස් දක්විණි. පැන පිළිවිසුම, විසැඳුම් වස් දුන් අප'තර වනුයේ ද සංවාද යි. මේ සබයේ සියලු සැබියෝ හුරුපුරුදු වියත් වහර මැ දෙඩති. එහෙත් ඔවුන් ගේ ඒ දෙඩුම්හි අසබා ගතියෙක් නැති. හින්සැරය, මඟුල් කෑම, හත්පණ ඈ පැබඳුම් ද බැලුව මැනැවි. එහි අලි හාමි, ගෝණ හාමි, හිවල් හාමි ආදීහූ කො තරම් ජයට රුවට නිවැරැදි බස කතා කෙරෙත් ද? එ පැබැඳුම්හි දෙසුම් සොබාහුරු නො වන බව කියන්නේ නැති. රැසකට පොදු නිවැරැදි දෙසුම් ආරක් වියැ යුතු යි. පෙදෙස් වහර පෙදෙසකට මිසැ මුළු රටට මැ පොදුවේ වැහැරැවියැ නොහැකි හෙයින් එ ගත් බසට ඇතුළු කිරීම අදහස් නිරවුල් වැ තේරුම් ගැනීමට සරසෙකි' යි මුළු නයු අසුන හෙබැවූ විනි විතාරණ සූරිහු පැවැසූ හ.

හෙළ හවුලේ සකසුරු අනඳපිය කුඩාතිහියෝ පින් දීම කළ හ.

සිටිනාමළුවේ සුමනරුවන් හිමි
කලණරුවන් සුමනදස්
(හවුලේ සකසුරුවෝ)

දැ නු ම

දැනුමැ'ති සහ
ගිය ගිය අත
ලබා සැපත
බැබැළෙනු ඇත

ඔබේ දැනුම
පිණිසැ 'දැනුම'
හොඳ යි අද ම
ලබා— ගැනුම

'දැනුමෙකි' මිල
වෙයි රුපියල
සුළු යැ එ මිල
විපුල යැ ඵල

කොළඹ - 1
ගෆූර් මක්දීරමස් - 29 1/9
දැනුම ප්‍රකාශකයෝ

පු ර ස

හෙළ බස

ඔසොවුව

සඳහා

පැවැත්වේ.

2 මරදනේ — 679

අනඳපිය කුඩාතිගි
හෙළ හවුල් සකසුරු

ගල්කිස්සේ හුළුදගොඩ පාරේ, 20/1 හි නිවැසි ලියනගේ ජිනදසුන් විසින් එ තන්හි මැ පිහිටි
"අජිත්" පහරුයෙහි පහරවා පළ කැරිණි.